
සතුට සොයා
තාරක ශ්‍රී කාන්ත

සතුට සොයා

තාරක ශ්‍රී කාන්ත

පොතෙහි සාරය

- විශේෂයෙන්ම පුද්ගලයෙකුගේ ආකල්ප වෙනස් කිරීම්වලට අදාළ කරුණු ඇතුළත් වේ.

- මනෝවිද්‍යාත්මක කරුණු ඇතුළත් වේ.

- බෞද්ධ ධර්ම කරුණු ඇතුළත් වේ.

- මා විසින් කරන ලද සත්‍ය පර්යේෂණ කරුණු, චිනම් දියමන්ති ගැන, ඖෂධ ගැන, චික් අයෙකුගේ ශරීර ස්පර්ශයක් තව අයෙකුට බලපාන්නේ කෙසේද වැනි කරුණු මෙම කෘතියට සාහිත්‍යමය ස්වරූපයෙන් ඇතුළත් කර තිබේ.

- සොබාදහමේ ක්‍රියාකාරීත්වයට වැඩි ඉඩක් ලබා දෙන කරුණු ඇතුළත් කර තිබේ.

තුති පිදුම

පොතෙහි අඩුපාඩු පෙන්වා දෙමින් මා ධෛර්යවත් වන ලෙස කටයුතු කල පූජ්‍ය උඩුගම බේමානන්ද හිමියන්ටත්, පූජ්‍ය කන්තලේ භාරත හිමියන්ටත්, සෝමා විමලධර්ම මහත්මියටත් මාගේ හද පිරි ගෞරව ස්තුතිය පිරිනමමි.

කෘතිය ටයිප් කර අන්තර්ජාලයට යොමු කිරීමට සහය ලබා දුන් පොල්ගහවෙල, කෑගල්ල පාරේ CEBIT COMPUTER ආයතනයේ අධිපති කමල් ලක්ෂමන් විජේරත්න මහතාටත් ස්තූති වන්ත වෙමි.

මෙහි නම් සඳහන් නොවුනත් මට නොයෙක් අයුරින් උදව් උපකාර කළ, මා ධෛර්යවත් කළ සියලු දෙනාටත් මාගේ ස්තූතිය පිරිනමමි.

මම,
තාරක ශ්‍රී කාන්ත

2019 සැප්තැම්බර් 23 වැනි දින දී.

අංක 196/5,
කෑගල්ල පාර,
පොල්ගහවෙල.
දුර. 071-6489525

සතුට සොයා

ISBN - 978-955-38808-1-9

කර්තෘ ප්‍රකාශනයකි.

කර්තෘගේ වෙනත් කෘති

ගුප්ත කරුණු සහ ග්‍රහ රාශි, භාව විස්තර

ISBN – 978-955-29-0658-9

වාසනා පොත් ප්‍රකාශනයකි.

සඳැස් නිසඳැස්

ISBN – 978-955-38808-0-2

කර්තෘ ප්‍රකාශනයකි.

01 වැනි පරිච්ඡේදය

තරුණයෙක් වැව ළඟ හිඳිමින් වැවේ නිසල ජලයට කුඩා ගල්කැට දමමින් ජලතරංග නැගෙන ආකාරය බලාසිටියි.

මේ ළමයා, කුඹුක්ගම ඉස්පිරිතාලෙට තව හුඟක් දුරද?

එලෙස ඇසුවේ රථයකින් බැස ආ උසට සරිලන මහතකින් යුත් තේජවන්ත පුද්ගලයෙකි. වැව් බැම්මේ වාඩිවී සිටි තරුණයා එක පාරටම තිගැස්සී පිටුපස බලන්නට විය. ඔහුට දැකගැනීමට හැකිවූයේ උසට සරිලන මහතින් යුත් තේජවන්ත පුද්ගලයෙකු සහ මෝටර් රථයක් තුළ සිටින තවත් කීප දෙනෙකි. මෝටර් රථයේ පිටුපස අසුනේ අයිනේ වාඩි වී සිටි රූමත් තරුණිය දෙස එම තරුණයාගේ නෙත් කාව නාභිගත වන්නට විය. එය දුටු රූමත් තරුණිය කිසිදා නොදුටු තරුණයාට මනුස්සකම පිරුනු මද සිනාවකින් සංග්‍රහ කරන්නට විය. ඒ සමගම කලින් කී පුද්ගලයා නැවතත් කුඹුක් ගම රෝහලට යන පාර විමසන්නට විය.

ඔය ඉස්සරහ තියෙන හන්දියෙන් දකුණට දාලා යන්ඩ. එතන ඉඳලා වැඩි දුරක් නෑ. තරුණයා පිළිතුරු දෙන්නට විය.

තරුණයාට තුති පුදමින් රථය පිටත් වන්නට විය.

මෙම කුඹුක්ගම ගම්මානය වූ කළි වියළි කලාපයේ පිහිටි ඉතාමත් සුන්දර ඉපැරණි ගම්මානයකි. එහි ගැමියන්ගේ ප්‍රධාන ජීවන මාර්ගය ගොවිතැනයි. කුඹුක් ගම නමට සරිලන සේ ගමේ කුඹුක් ගස් ද බහුලව දක්නට ලැබේ. මේ ගමෙහි කුඹුරුවලට ජලය සපයන වැවක් ද දක්නට ලැබේ.

කුඹුක්ගම යන නම සෑදී ඇති ආකාරය පිළිබඳ විවිධ අදහස් පවතී. ඉන් එක් අදහසක් වන්නේ කුඹුක් ගස් වැඩි ප්‍රමාණයක් තිබීම අනුව ගමේ නම කුඹුක් ගම වීය යන්නයි. අනෙක් මතය නම් මහා රාවණා රජතුමාගේ එක්

සහෝදරයෙක් වන කුම්භකර්ණ යෝධයා කලක් මේ ප්‍රදේශයේ සිටි බවත් ඒ අනුව කුම්භකර්ණ සිටි ගම කුඹුක් ගම වූ බවත් මතයක් පවති.

එහි ගැමියන් පවසන පරිදි මෙම යෝධයාට කුම්භකර්ණ නම යෙදී ඇත්තේ, කුඹුරු කර වූ හෙයින් කුම්භකර්ණ යන අර්ථයෙනි.

ලෝකයා කුම්භකර්ණගේ නිදාගැනීම ගැන මොන දේ කීවත් ඔවුන් කුම්භකර්ණ යෝධයා ගැන පවසන්නේ වෙනස්ම කතාවකි. එනම් කුම්භකර්ණ යෝධයා කුඹුරු වගා කොට ඒවා පැසෙන තුරු භාවනායෝගීව සිටින බවත්, එම භාවනාවෙන් ඔහු මුදවාලීමට අපහසු බවත් යන්නය. එය නිදාගැනීමක් ලෙස සලකා ඔහුගේ කීර්තිනාමයට සහ ඉතිහාසයට මඩ ගසා ඇති බව ඔවුන් ප්‍රකාශ කරයි.

කලින් සඳහන් කරන ලද රථයේ පිටුපස අසුනේ සිට තරුණයා සමග සිනාසුනේ කුඹුක් ගම රෝහලට අලුතින් පත් වී ආ දොස්තර නෝනායි. ඇය උසට සරිලන මහතින් යුත් අප රටේ හැටියට තරමක් උස ශරීරයකට හිමිකම් කියන සුන්දර යුවතියකි. ඇය නමින් සෞම්‍යා සෙව්වන්දි ගජධීරයි.

ඇගේ මුහුණ සුදු පාටින් යුක්ත වන අතර ඇස් තුළ තියුණු පෙනුමකුත්, කාන්තිමත් ප්‍රියමනාප ස්වභාවයකුත් දක්නට ඇත. මුහුණේ ගරුගාම්භීර පෙනුමක් මෙන්ම තවපසෙකින් නමට සරිලන සෞම්‍ය ගතියකුත් දක්නට ඇත. දෑතේ ඇඟිලි දිගට පිහිටා ඇති අතර නිකට රවුම් ස්වභාවයක් ගනී. කෙස් තදින් කැරලි ගැසී නැතත් තරමක් දුරට කැරලි ගැසී ඇති තද කලු පාට නිරෝගී කෙස් කළඹකට හිමිකම් කියයි. වචන ඍජුවම කථාකරන අතර වචන අතර අවශ්‍ය ප්‍රමාණයට හිස්තැන් තබමින් කථා කරයි. විහිලු කරතත් එය ඉතාම කලාතුරකිනි.

මෙය අලුතින් කුඹුක්ගම රෝහලට පත්වී ආ දොස්තර නොනාගේ ප්‍රථම පත්වීමයි. ඇයට අමතරව මෙම රෝහලේ තවත් දොස්තර නෝනා කෙනෙකු සිටින අතර ඇය නමින් ජයමිනි විමලධර්මයි. ඇය විවාහ වී සිටින අතර ඇය රෝහලේ වෛද්‍යවරුන් සඳහා ඇති නිල නිවසේ පදිංචිව සිටී. වෛද්‍යවරුන් සඳහා එම රෝහලේ තවත් නිල නිවසක් ඇතත් අලුත් දොස්තර නෝනා එහි නතර කිරීමට ඇයගේ පියාවන සෙනරත් ගජධීර මහතා අකමැතිය.

අලුත් දොස්තර නෝනාගේ පියා වන සෙනරත් ගජධීර මහතා සෘජුබැල්මක් ඇති උසට සරිලන මහතින් යුත් තේජවන්ත පුද්ගලයෙකි. ඔහුට ඝනව වැඩුණු උඩු රැවුලක් ඇති අතර කටහඬ ගරුගාම්භීර මෙන්ම ඈතට වීහිදී යන ස්වභාවයකින් ද යුක්ත වේ. කෙටියෙන් කථාකරන අතර නිශ්ශබ්දතාවය වඩා ප්‍රිය කරයි. ඔහු පරිපාලන ක්ෂේත්‍රයේ සිට මෑතකදී විශ්‍රාම ගිය දිසාපතිවරයෙකි. දැනට සමාජ සේවා කටයුතුවල නිරත වන අතර එතුමන්ට මුළු දිවයිනටම සෘජු විනිසුරු කමක් ද හිමි වී ඇත.

සෙනරත් ගජධීර මහතාගේ මෝටර් රථය කාලයේ හැටියට තරමක් මිල අධික වන අතර ඔහුට තිබෙන ගරු ගාම්භීර පෙනුමට සරිලන රථයකි.

ගජධීර මහතාත් බිරිඳ සහ දියණිවරු දෙදෙනාත් නිවසේ මෙහෙකාර කාන්තාවත් කුඹුක්ගම රෝහලට පිවිසෙයි.

ඔවුන් එන දෙස විපරම් දැසින් බලා සිටින්නේ කුඹුක්ගම රෝහලේ සාත්තු සේවකයෙකු වන පියදාසය.

පියදාස කුඹුක්ගම රෝහලේ වැඩකරන වයස අවුරුදු හතලිස් පහක් පමණ වන සාත්තු සේවකයෙකි. ඔහුට කලු පාට ඝන කොන්ඩයක් පිහිටා ඇති අතර එය තැලූ පොල් ලෙල්ලක් සේ පිටුපසට පීරා ඇත. ගැමියන් පවසන පරිදි ඔහුට ඇත්තේ පොල් දත්ය. එනම් තරමක් විශාල සුදු පාට දත් යන්නය. ඔහු වැඩිපුර අඳින්නේ සුදු පාට ඇඳුම් ය. ඔහු යම් යම් කාරණා නිසා රෝහලේ මෙන්ම ප්‍රදේශයේ ද ජනප්‍රිය පුද්ගලයෙකි.

සිනාමුසු මුහුණින් බලා සිටි පියදාස දුටු ගජදීර මහතා පියදාසගෙන් මෙසේ විමසන්නට විය.

"අපට දොස්තර නෝනා හම්බවෙන්ඩ ඕනෙ"

ආ..... එන්ඩ මහත්තයා මම එක්කරගෙන යන්නම්

ගජධීර මහතා සහ පිරිස පියදාස සමග රෝහලේ සේවයේ නියතු දොස්තර නෝනා ළඟට පිවිසෙයි.

මම හිතන්නෙ මේ අලුතෙන් මෙහෙට එනවා කීව දොස්තර නෝනා වෙන්න ඇති.

"ඔව් ඒ මම තමයි" සෞම්‍යා ගජධීර මෙනවිය පිළිතුරු දෙන්නට විය.

මට විනාඩි පහක් දෙන්ඩ අපි ක්වාටස් එකට ගිහිල්ලා කතා කරමු.

අමුත්තන් සියලු දෙනා සමග වෛද්‍යවරිය තම නිල නිවසට පිවිසෙයි.

මම බොන්ඩ මොනව හරි හදාගෙන එනකල් කේක් කෑල්ලක් කමු.

ටික වේලාවකට පසු දොස්තර නෝනා බීම හදාගෙන එයි.

තව කේක් කෑල්ලක් කාලා බීම ටිකක් බොමු.

බොහොම ස්තුතියි. ගජධීර මහතා දොස්තර නෝනාට තුති පුදන්නට විය.

මිස් සෞම්‍යා දැන් කොහෙද නතර වෙන්නෙ. මම එහා පැත්තෙ ක්වාටස් එකනම් පියදාසට කියල සුද්ද කෙරෙව්වා. ඔයාට කැමතිනම් ඒකෙ නතර වෙන්න පුලුවන්. දුර ඉඳලා ආව නිසා අද ඔක්කෝටම ඒකෙ නතර වෙන්න පුලුවන්. මේ දවස් දෙකට කෑම ඔයාලට අපේ ගෙදරින්.

මිසිස් විමලධර්ම අපේ වැඩි කැමැත්තක් නෑ අපේ දුව ක්වාටස් එකේ නතර වෙනවට. බැරිවෙයිද මේ පැත්තෙන් ගෙයක් හොයාගන්ඩ.

හොඳයි අපි උත්සහ කරලා බලමු.

ලීලා, ලීලා

ඇයි නෝනා.

ලීලා ගිහිල්ලා පියදාසට එන්ඩ කියන්ඩ. ජයමිනි දොස්තර නෝනා තම ගෙදර සේවිකාව අමතමින් කීවාය.

ටික වේලාවකට පසු පියදාස පැමිණෙයි.

මොකද නෝනා මට එන්ඩ කීවෙ.

පියදාස මේ මෙහාට අලුතෙන් පත්වෙලා ආව දොස්තර නෝනා. මේ නෝනට මේ පැත්තෙන් නවතින්න පුළුවන් තැනක් හොයනවා. හැබැයි මේ ළඟින්ම වෙන්නත් ඕනෙ. තැනක් හොයලා කියනවද පියදාස.

ලොකු ඉස්කෝලෙ මහත්තයාලගෙ ගෙදර කාමරයක් නම් තිබුණා, මොකද දුව කසාද බැඳලා ටිකක් දුර ඉන්නෙ. මට පුළුවන් එහෙන් අහල බලන්න.

"අනේ ලොකු උදව්වක් පියදාස" ගජධීර මහතා පවසන්නට විය.

පියදාස අද කීයටද off වෙන්නෙ.

එකට off වෙනවා නෝනා.

එහෙනං යමින් ගමන් බලාගෙන යන්න පුළුවන් නේද?

ඔව් නෝනා.

සවස 05.00 පමණ වන විට පියදාස ඔහුගේ පාපැදියෙන් පැමිණ ජයමිනි දොස්තර නෝනාට පණිවිඩය පවසන්නට විය.

"ලීලා" "ලීලා" දොස්තර නෝනා ලීලාට කථාකර අලුත් දොස්තර නෝනාට පැමිණෙන ලෙස දන්වා සිටී.

ලීලා ගොස් පණිවිඩය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව අලුත් දොස්තර නෝනාත් ඇගේ පියාත් ජයමිනි දොස්තර නෝනා හමුවෙයි.

මිස්ට ගජධීර ලොකු ඉස්කෝලෙ මහත්තෙලාගෙ ගෙදර මිස් සෞම්‍යට නතර වෙන්න පුළුවන්. ඔයාලා දැන් යන්න ඕනෙ නෑ. ගොඩක් හවස් උනානේ. ඒක හින්දා හෙට උදේ ගිහිල්ලා ලොකු ඉස්කෝලෙ මහත්තයා මුණගැහෙන්ඩ. මම පියදාසත් එවන්නම්.

පසුදින උදෑසන 9.00 ට පමණ පියදාසත් ගජධීර මහතා ඇතුළු පිරිසත් ලොකු ඉස්කෝලෙ මහතාගේ නිවසට පිවිසෙන්නට විය.

ලොකු ඉස්කෝලෙ මහතා ගමේ සිටින කවුරුත් ගරු කරන ප්‍රභූ පුද්ගලයෙකි. බොහෝවිට අද්දිග ෂර්ට් අඳින අතර වචන පිළිවෙළට හසුරුවන

පුද්ගලයෙකි. ඔහුගේ කටහඬෙහි කීමට අපහසු විශේෂත්වයක් ද පවතී. ශරීරය උස වන අතර ඇඟිලි දිගට පිහිටා ඇත. මද සිනහවකින් යුක්ත වන අතර එයද අවශ්‍ය තැනකදී පමණි.

ලොකු ඉස්කෝලෙ හාමිනේ නිතරම ලොකු ඉස්කෝලෙ මහතා අසල රැඳෙමින් ඔහුගේ වැඩවලට සහයෝගය ලබා දෙයි. ඇයද ගුරුවරියකි. ලොකු ඉස්කෝලෙ මහතාට සාපේක්ෂව ලොකු ඉස්කෝලෙ හාමිනේ තරමක් මිටිය. නමුත් ඇගේ කාර්යශූරත්වය ලොකු ඉස්කෝලෙ මහතාට විශාල සවියකි. ලොකු ඉස්කෝලෙ හාමිනේ ඔසරිය අඳින අතර නෙරිය ඉතා පිළිවෙළකට සකසා අඳියි.

ආ..... පියදාස එන්ඩ එන්ඩ. මේ දොස්තර නෝනගෙ තාත්තා වෙන්ඩ ඇති.

ඔව් ඉස්කෝලෙ මහත්තයා. එලෙස ප්‍රකාශකළේ ගජධීර මහතායි.

එහෙමනං ඔක්කොමලා ඇවිල්ලා වාඩිවෙන්න

ගජධීර මහතාගේ බිරිඳ කේක් පෙට්ටියක් අසල තිබුණු කනප්පුව උඩ තබමින් වාඩි වෙයි. ලොකු ඉස්කෝලෙ හාමිනේ ද සිනාමුසු මුහුණින් අමුත්තන් සියලු දෙනා පිළිගැනීමට ඉදිරියට පැමිණෙයි.

මේ..... හාමිනේ ගිහිල්ලා තේ වතුර ටිකක් ලෑස්ති කරන්ඩ. මේ කට්ටියට බොන්ඩ.

හා හොඳයි මහත්තයා. ඉස්කෝලෙ හාමිනේ පිළිතුරු දෙන්නට විය.

පියදාස මගෙන් ඇවිල්ලා ඇහුවා නෝනා කෙනෙක් ඉන්නවා මෙහෙ බෝඩිං කරගන්න පුලුවන්ද කියලා. මම ගත් කටටම කීවේ බෑ කියලා. පස්සෙ තමයි කීවෙ ඉස්පිරිතාලෙට අලුතෙන් පත්වෙලා ආව දොස්තර නෝනා කියලා. ඉතින් බෑ කියන්ඩ බෑනෙ.

මේ මහත්තෙලා කොහෙද

අපි හොරණ

මමයි අපේ නෝනයි වැඩට ඉන්න මැගිලිනුයි විතරයි ඉන්නෙ ඉස්සර නම් අපේ දුවත් හිටියා. දැන් එයා කසාද බැඳලා කළුතර ඉන්නෙ.

මේ මහත්තයා කොහෙද වැඩ කරන්නෙ.

මම දිසාපති කෙනෙක් විදිහට වැඩ කළේ දැන්නම් පැන්ෂන්.

ඉස්කෝලෙ හාමිනේ අසල තිබුණ මේසයක් ළංකර අමුත්තන් පිරිසට කෑමට ලැවරියත්, පුස්නාප්පත්, කෙසෙල් ගෙඩිත් තබයි. ඒත් සමගම මැගිලින් තේ හදාගෙන පැමිණෙයි.

කට්ටියම ලැවරිය, පුස්නාප්ප කාලා තේ ටිකක් බොමු. එලෙස පැවැසුවේ ලොකු ඉස්කෝලෙ මහතායි. සැවොම තේ බීමෙන් අනතුරුව පියදාස පිටත් වී ගිය අතර ගජධීර මහතාත් ලොකු ඉස්කෝලෙ මහතාත් සතුටු සාමීචියක යෙදෙන්නට විය. ඉස්කෝලෙ හාමිනේ අමුත්තන් පිරිසට නවාතැන් පහසුකම් සඳහා තිබෙන කාමරය පෙන්වන්නට විය.

පැයක් හමාරක් ගිය පසු

"සෙනේ අපි යමු නේද" එලෙස පැවැසුවේ ගජධීර මහතාගේ බිරිඳයි.

අලුත් දොස්තර නෝනා තම මවුපියන්ගේ පාද වැඳ එකම සහෝදරිය වැළඳ ගනිමින්, ඉන්පසු තම නිවසේ මෙහෙකාර සේවයේ නියුතු සිරියාවතීගේ අතින් අල්ලා ඇයට සුහද අවවාද දෙමින් පිරිසට සමුදෙන්නට විය. දොස්තර නෝනා තම මව්පියන් පිටත් වුණු රථය නොපෙනී යනතුරු බලා සිටී. ඇය පිටුපසින් සිටි ලොකු ඉස්කෝලෙ හාමිනේ ඇගේ දෙඋර අල්ලා දුව දැන් තමන්ගෙ ගෙදර ඉන්නවා කියලා හිතාගන්ඩ, කියමින් දොස්තර නෝනා නිවස තුළට කැඳවාගෙන යයි.

02 වැනි පරිච්ඡේදය

මාලනී, මාලිනී ගමේ සිටින සමාජශීලී ගති ඇති සුන්දර යුවතියකි. මාලිනීට පිහිටා ඇත්තේ බලාපොරොත්තු දල්වා ගත් නෙත් යුගලක් කීවොත් නිවැරදිය. ගමේ කරන පොදු වැඩවලදී ඇගේ සහයෝගය ගමට ලැබේ. ඇය විසිතුරු මල් වගාවට ද ප්‍රියතාවයක් දක්වයි. ලොකු ඉස්කෝලෙ මහතාගේ නිවසට ගෙවල් තුන හතරක් ඈතින් මාලනීගේ නිවස පිහිටා ඇත. ලොකු

ඉස්කෝලෙ හාමිනේගේ යම් යම් කටයුතු සඳහා මාලනී නිතර නිතර ගුරු ගෙදරට යන එන කෙනෙකි.

දිනක් දොස්තර නෝනා ගුරුගෙදරින් මීටර් දහයක් දොළහක් පමණ ඈතින් පිහිටි බිම්මලක් හැඩැති තනි කනුවේ කුටියට වී පොතක් බලමින් සිටි මොහොතක ඇයට තේ පිළිගන්වන ලෙස තේත් වැලිතලප කෑලි කීපයකුත් ලොකු ඉස්කෝලෙ හාමිනේ මාලනී අතට දෙයි.

මාලනී අලුත් දොස්තර නෝනා ළඟට ගොස් මේ..... නෝනා යැයි ඇදෙන සුලු ස්වරයෙන් දොස්තර නෝනා අමතන්නට විය.

දොස්තර නෝනා පොතෙන් දෑස් ඉවතට ගෙන මද සිනහවක් පාමින් පොතේ කියවූ තැන සොයාගැනීමට සලකුණක් තබමින් ඔයාද මාලනී කියා මාලනීගෙන් විමසන්නට විය.

ඔව් නෝනා, මාලනී පිළිතුරු දෙන්නට විය.

මට ඉස්කෝලෙ හාමිනේ කියලා තිබුනා. අනුමානෙටයි ඇහුවෙ මාලනී මේ ළඟද ඉන්නෙ.

ඔව් නෝනා මෙහෙ ඉඳලා ගෙවල් තුන හතරකට දුරින්.

මාලනී තේ බීවද?

මම තව ටිකකින් බොන්නම් නෝනා.

මාලනී හිටගෙන ඉන්නෙ ඉඳගන්ඩ

මාලනීගෙ දෙමව්පියෝ මොකද කරන්නෙ.

ගොවිතැන් නෝනා.

වැලිතලප කා තේ බී අවසන් වූ දොස්තර නෝනා තේ කෝප්පයත් පීරිසියත් මාලනී අතට දෙන්නට විය.

03 වැනි පරිච්ඡේදය

ඇසිලින් නෝනා කරුණාවතී පසුකර ගුරු ගෙදර දෙසට එන්නට විය.

ඈ ඇසිලින් අර කරුණාවතී කාටද දොස් කියන්නෙ. ඇසිලින් නෝනාගෙන් එලෙස ඇසුවේ තම නිවසේ ගේට්ටුව අසල සිටින ලොකු ඉස්කෝලෙ හාමිනේය.

දැකල පුරුදු කෙනෙක් වගේ ආ..... ඒ අපේ පංසලේ ඉඳලා සිවුරු ඇරලා ගිය ධම්මරතන හාමුදුරුවෝ නේද?

ලොකු ඉස්කෝලෙ හාමිනේ හැඳිනගත්තා ය.

ඔව් ඉස්කෝලෙ හාමිනේ. ඒ කාලේ දානෙත් දුන්නා, පිරිකරත් පූජාකරා, ඉගෙනගන්න අවශ්‍ය දේවලුත් දුන්නා, වැඳලත් තියෙනවා කියලා තමයි කරුණාවතී කිසිම කරුණාවක් නැතුව දොස් කියන්නෙ. අපි දුන්න වැන්ද දේවල්වලින් කිසිම වැඩක් නෑ කියලා දොස්කියනවා.

ඒ අතරතුර ලොකු ඉස්කෝලෙ මහතා ද මේ ස්ථානයට පැමිණෙයි.

මොකද මේ කට්ටිය කථාව

ලොකු ඉස්කෝලෙ හාමිනේ සිදුවූ සියල්ල ලොකු ඉස්කෝලෙ මහතාට ප්‍රකාශ කරන්නට විය. ඉන්පසු ලොකු ඉස්කෝලෙ මහතා හඬ අවදිකරමින්

බලන්ඩ කරුණාවතී කරගන තියන මෝඩ වැඩේ. අපේ ආගමේ හැටියට දානයක් දෙන්ඩ ඕනෙ තුන්සිත පහදවාගෙන. ඒ කියන්නෙ දානෙ දෙන්ඩ කලිනුයි, දානෙ දෙනකොටයි, දානෙ දුන්නට පස්සෙයි දානෙ ගැන හිත පැහැදිලා තියෙන්න ඕනෙ.

දවසක් දානෙකදි දානෙ වළඳලා කරන දේශනාවෙදි හාමුදුරුවෝ කියනවා අහගෙන දැන්තමයි දානෙ වැඩකටයුතු ආරම්භ උනේ කියලා. ඒකෙන් උන්වහන්සෙ අදහස් කළේ දානෙ දීමෙන් පස්සෙත් දුන්න දානෙ ගැන හිත පහදවා පවත්වාගන යන්න ඕනෙ කියන එක. ඔය සිදුවීමේ හැටියට කරුණාවතී

නොකරන්නෙත් ඔය ටිකමයි. මට මතකයි ඒ කාලෙ ඔය ධම්මරතන හාමුදුරුවන්ට කරුණාවතී දාන මාන දුන්නෙ උදව් කළේ බොහොම ශ්‍රද්ධාවෙන්. හාමුදුරුවෝ පස්සෙ වෙනස් උනාට දානෙ දෙන අවස්ථාවේ හොඳින් සිල් රැකගන ඉන්න ඇති. හාමුදුරුවෝ මොකක් හරි හේතුවක් නිසා සිවුරු ඇරලා ගියාට ඒක ප්‍රශ්නයක් කරගන දුන්න දේවල් ගැන දුක්වෙන්න හොඳ නෑ. දුන්න දානෙ ගැන දුක් උනාම ඒ දානෙ තියන ආනිසංස අඩුවෙනවා කියලා තමයි ධර්මයේ සඳහන් වෙන්නෙ. ඒ විදිහට බලනකොට කරුණාවතී කරගන තියෙන්නෙ මහම මහ මෝඩ වැඩක්.

ගොඩක් දෙනෙක් දහස් ගණන් ලක්ෂ ගණන් මුදල් වියදම් කරලා දන් දීලා පස්සෙ දුක් වෙනවා. එහෙම උනාම පින අඩු වෙනවා. දෙන්ඩගත්තු මහන්සියත් ඒකෙන් අපතෙ යනවා. ඒ නිසා පස්සෙ මොන ප්‍රශ්න ආවත් අපි දානයක් දුන්නා කියලා සතුටු වෙන්න ඕනෙ.

අනිත් කාරණේ තමයි දානෙන් ලැබෙන ආනිසංස පැත්තකින් තියමුකො. කරුණාවතී දන්දීලත් ඒ ගැන පසුතැවෙන්නෙ දුක්වෙන්නෙ ඇයි.

"ඒක නම් දන්නෙ නෑ ඉස්කෝලෙ මහත්තයා" ඇසිලින් නෝනා පිළිතුරු දෙන්නට විය.

ඒ දානෙ ක්‍රියාවෙන් දුන්නට හිතෙන් නොදුන් නිසා.

අපි දෙයක් දානයක් වශයෙන් දෙනකොට ඒකෙ අයිතිය ක්‍රියාවෙන් විතරක් නෙවෙයි අපේ හිතිනුත් අත්හැරගන්න ඕනෙ. දෙන දේ ලබාගත්තු කෙනා ඒ දේට මොනවා කරත් ඒක අපිට ප්‍රශ්නයක් වෙන්න බෑ. එහෙම ප්‍රශ්නයක් වෙනවනම් අපි දුන්න දේ හිතින් පවරලා දීලා නෑ.

හිතින්ම දෙන දේ පවරලා දුන්නනම් ඒ දුන්න දේට මොනවා උනත් මොනවා කරත් අපිට දුකක් තරහක් ඇතිවෙන්ඩ විදිහක් නෑ. මොකද ඒක තවදුරටත් අපේ නොවන නිසා. අද ගොඩක් දෙනෙක් දෙයක් දීලා කියනවා අපි දුන්න දේවල කිසිම අගයක් නෑ. අපි දුන්නට දුන්න දේ ගැන කිසිම කෙළෙහි ගුණයක්වත් නෑ කියලා. දෙන දේ අයිතිය හිතින්ම අස්කරගන දුන්නනම් ඒ දේ දැන් අපේ නෙවෙයි. එතකොට ඒ දේට මොනවා උනත්, ලබාගත්තු කෙනා මොන විදිහට ක්‍රියා කළත්, අපිට දුකක් ඇති වෙන්ඩ බෑ.

ඉස්කෝලෙ මහතාගේ දීර්ඝ දේශනාවෙන් අනතුරුව ඇසිලින් නෝනා දීර්ඝ හුස්මක් ගෙන පිට කරන්නට විය. ඇසිලින් නෝනා ඉවුම් පිහුම් වැඩටත් රසකැවිලි හොඳින් හැදීමටත් දන්නා ගමේ සිටින ජ්‍යෙෂ්ඨ කාන්තාවකි. ඇය විශේෂ අවස්ථාවලදී ලොකු ඉස්කෝලෙ හාමිනේගෙ සහයට පැමිණ, ඉවුම් පිහුම් ආදියෙන් උදව් කරන කාන්තාවකි.

04 වැනි පරිච්ඡේදය

ටික දිනක් ගතවීමෙන් පසු මාලනීත් දොස්තර නෝනාත් ගජ මිතුරියන් විය. ගජමිතුරියන් වූවාට දොස්තර නෝනා මාලනී ආශ්‍රය කරන්නේ තම වෘත්තියේ ද ගෞරවය රැකගනය. මාලනී ද දොස්තර නෝනා ආශ්‍රය කරන්නේ දොස්තර නෝනාට අදාළ ගෞරවය ලබාදෙමිනි.

දිනක් උදේ වරුවක දොස්තර නෝනාත් මාලනීත් ගැමිසිරි නරඹමින් වැව් බැම්ම දිගේ යනවිට ඉදිරියට මුණගැසුණේ උදැල්ලක් කරේ තබාගෙන යන බණ්ඩයියා ය.

නෝනා ඒ තමයි බණ්ඩයියා. අපේ ගමේ ඉන්න හොඳ ගොවි මහත්තයෙක්. හොඳට සල්ලිත් තියෙනවා. ඒ උනාට සල්ලි අඩු කාලේ ඉඳලා කරගෙන ආපු ගොවිතැන් වැඩ තාමත් හොඳට කරගෙන යනවා.

එහෙම නම් බණ්ඩයියා වගාව නිසා තෘප්තියක් ලබන හොඳ ගොවි මහත්තයෙක්.

නෝනා දන්නවද ඔය බණ්ඩයියගෙ සහෝදරයෙක් තමයි අපේ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා. එතුමත් කුඹුරට බැහැලා වැඩ කරන්න කැමති කෙනෙක්.

මාලනී ප්‍රාදේශීය සභා සභාපතිවරු විතරක් නෙවෙයි අපේ රටේ ඇමතිවරුත් හිටියා කුඹුරට බැහැලා වැඩ කරලා පාර්ලිමේන්තු ගිය අය.

මාලනී මං දැකලා තියෙන විදිහට හොයලා බලලා තියන විදිහට ගස්වැල්වලට ආදරය කරන ගොවිතැනට ආදරය කරන මිනිස්සු ඉන්නවා ඒ අය ගොඩක් නිරෝගියි. ඒ වගේම ගොඩක් කල් ජීවත් වෙනවා. ඒ අයගේ විනෝදාංශය ගස්වැල්වලට ආදරය කිරීම, ගොවිතැනට ආදරය කිරීම.

අද නිරෝගී ජීවිත ගත කරන පුද්ගලයෝ ගත්තොත් ඒ අයගෙන් වැඩි දෙනා සොබාදහමට ආදරය කරන, සරල ජීවිත ගතකරන උදවිය. අපි හැමෝම ඉන්නෙ සොබාදහම කියන ගේ ඇතුළේ සොබාදහම කියන ගේ ඇතුළේ ඉන්නකොට අපට ඕනෑ ඕනෑ විදිහට ඉන්ඩ බෑ. සොබාදහමටත් යම්තාක් දුරකට අවනත වෙනඩ සිද්ද වෙනවා. එහෙම නැති උනොත් ස්වාභාවික විපත්, ලෙඩ රෝග, හදිසි කරදර වගේ දඬුවම් විඳින්න සිද්ධ වෙනවා.

මං හිතන්නෙ අපේ රටටත් ගැලපෙන්නෙ සොබාදහමත් එක්ක යන ආර්ථික රටාවක්. අපේ ජාතික ප්‍රතිපත්තියත් එහෙම ආර්ථික රටාවකට හුරුනොවුනොත් අපටත් සොබාදහමෙන් දඬුවම් විඳින්න සිද්ද වෙයි.

කොටින්ම කියනවා නම් කෘෂිකර්මය මුලික වෙච්ච ඖෂධ නිෂ්පාදනය මූලික වෙච්ච අපේ දෙයින් පාරම්පරික දැනුමෙන් ප්‍රයෝජන ගන්න, ඒවා තුළින් පිටරටින් ආදායම් ලබන වැඩපිළිවෙළක් නම් ගොඩක් හොඳයි.

බණ්ඩයියා ගොවිතැන නිසා තෘප්තියක් ලබන හොඳ ගොවි මහත්තයෙක් කියලා නෝනා ඉස්සෙල්ලා කීවානේද?

ඔව් මාලනී

නෝනා ගොවිතැන් කටයුතු කියන්නෙ මහන්සි වෙලා කරන්න ඕනෙ කටයුත්තක්නෙ. ඉතින් ඒ වගේ කටයුත්තකින් කොහොමද තෘප්තියක්, සතුටක් ලබන්නෙ.

මාලනීගෙ කතාව ඇත්ත මටත් ගොවිතැන ගැන ලොකු අත්දැකීම් නෑ. නමුත් මාලනීගෙ අර ගොවිතැනට මහන්සි වෙන්න ඕනෙ කීව කතාවට දෙයක් කියන්න ඕනෙ. මාලනී නූතන ලෝකෙ මිනිස්සු මහන්සිවෙලා කටයුත්තක් කරනවා නමුත් ඒකට මහන්සි වෙනවා කියලා කියන්නෙ නෑ.

ඒ මොකක්ද නෝනා.

ඒ තමයි ශරීර සෞඛ්‍යය රැකගන්න, ඇඟ හැඩ කරගන්න කරන ව්‍යායාම. ව්‍යායාම කරන්න මහන්සි වෙන්න ඕනෙ. නමුත් ශරීර සෞඛ්‍යය රැකගැනීම, ඇඟ හැඩ කරගැනීම කියන සිතිවිලි ඔළුවේ තියෙනකොට මහන්සිය කියන මානසික සිතිවිල්ල තදින් දැනෙන්නෙ නෑ. ඉතින් ගොවිතැන් කරන එක ශරීර

සෞඛ්‍යයට, ඇඟ හැඩකරගන්න හොඳයි කියලා හිතුවොත් ගොවිතැන නිසා මහන්සි වෙන්න ඕනෙ කියන හිතේ තියන මානසික හැඟීම හිතින් අයින් වෙලා හිතට හොඳ ගැම්මක් එනවා. ගොවිතැනේ දී එහෙම ආකල්ප වෙනසකුත් අවශ්‍යයි.

අනිත් එක මාලනී ගොවිතැනේ දී පියවර ගණනාවක් තියනවා අවසාන ප්‍රතිඵලය ලබාගන්න. ඒ එක එක පියවර කලබල නැතිව, පිළිවෙළකට, ලස්සනට කරාම එතනත් හිතේ සියුම් සතුටක් ඇතිවෙනවා. ඒක ගොවිතැනට විතරක් නෙවෙයි. අනිත් වැඩවලටත් එහෙමමයි.

දොස්තර නෝනා රැයක් දවාලක් නැතුව ලෙඩ්ඩුත් එක්ක වැඩ කරනකොට දොස්තර නෝනට රස්සාව ගැන, එපාවෙන, කලකිරෙන, පසුගාමී හැඟීම් ඇති වන අවස්ථා නැද්ද?

මාලනී යථාර්ථය ගත්තහම රැකියාවක දුෂ්කර වගේම අකමැති කොටසකුත් තියෙනවා. නමුත් රැකියාව ගැන ශුභවාදී ආකල්ප ඇති කර ගැනීම තුළින්, රැකියාව ගැන ශුභවාදී දැක්ම තුළින් රැකියාව නිසා ඇතිවන දුෂ්කර වගේම අකමැති හැඟීම්වල පීඩනයෙන් සෑහෙන දුරට මිදෙන්න පුළුවන්.

උදාහරණයක් දෙන්ඩ පුලුවන්ද නෝනා

ඔව් මාලනී මැටි කර්මාන්තය කරන අය බොහොම දෙනෙක් හිතාගෙන ඉන්නවා අපි බොහොම පහත් අය මේ රැකියාව බොහොම පහත් රැකියාවක් කියලා. නමුත් මාලනී මැටි කර්මාන්තය කරන අය නැත්නම් මිනිස්සු කොහොමද උයාගෙන කන්නෙ.

ඇයි නෝනා ඇල්මිනියම් භාජන තියෙන්නෙ.

මාලනී ඇල්මිනියම් භාජනවලිනුයි මැටි භාජනවලිනුයි කෝකද හොඳ ?

සෞඛ්‍ය අතින් නම් මැටි භාජන හොඳයි නෝනා

ඉතින් මාලනී මැටි කර්මාන්තය කරන කෙනෙකුට හිතන්න පුළුවන් මම කරන රැකියාව නිසා තමයි මිනිස්සු සෞඛ්‍ය සම්පන්නව කෑම හදාගන්නෙ. සීතල වතුර ටිකක් මැටි කළයකින්, බුරුලේත්තුවකින් බොන්නෙ කියලා.

ශුද්ධ පවිත්‍ර කරන රැකියාවල නිරත වෙලා ඉන්න කට්ටියත් හීනමානයක් ඇති කරගෙන තියනවා ඒ අයගේ රැකියාව පහත් කියලා.

නමුත් මාලනී ඒ අය එක දවසක් වැඩ වර්ජනය කළොත් මොකද වෙන්නෙ. ඒකෙන් ගොඩක් දෙනෙක් අපහසුතාවයට පත්වෙනවා නේද? ඉතින් ඒ අය හිතන්න ඕනෙ අපි කරන රැකියාව නිසා තමයි පරිසරය ලස්සනට තියෙන්නෙ. මිනිස්සුන්ගෙ සෞඛ්‍ය රැකිලා තියෙන්නෙ කියලා. ඒ අය එහෙම හිතනවානම් තමන්ගෙ රැකියාව ගැන තියන පහත් පසුගාමී හැඟීම් නැති කරගන්න පුලුවන්.

එතකොට නෝනා, නෝනා කරන දොස්තර රස්සාව ගැන මොකද හිතන්නෙ.

මාලනී කෙනෙකුට ප්‍රතිකාර කරලා සුව උනාට පස්සෙ සිනාමුසු මූනින් ටිකට් කපලා යනවා දකිනකොට හිතට ලොකු සතුටක් දැනෙනවා. ඒ දර්ශනේ බලන්න මං හරි ආසයි.

මං අතින් ලෙඩෙක් සුව නොවුණත් මං ඒ ලෙඩා වෙනුවෙන් අවංකවම කැප උනා නේද කියන හැඟීමක් මගේ හිත තුළ තියෙනවා. ඒ නිසා මාලනී මං මිනිස්සුන්ට ප්‍රතිකාර කරලා සතුටක් ලබනවා.

05 වැනි පරිච්ඡේදය

මාලනී මිතුරියක සමග හිතවතෙකු බැලීම සඳහා කුඹුක්ගම රෝහලට පැමිණෙයි. රෝගියා බලා රෝගියා ගැන වැඩිපුර විස්තර දැනගැනීමට මාලනී තම මිතුරිය සමඟ අලුත් දොස්තර නෝනා වෙත පිවිසෙයි.

ආ..... මාලනී මොකද මේ පැත්තෙ.

මං අඳුරන ලෙඩෙක් නතරවෙලා ඉන්නවා. නෝනා අර පිරිමි වාට්ටුවේ 03 වෙනි ඇඳේ ඉන්න ලෙඩා.

ඒ ඔයාගේ කවුද මාලනී

අපේ ගමේ පොදු වැඩවලදි වැඩ කරන, අපිත් එක්ක එකට ඉගෙන ගත්තු යාලුවෙක්.

මෙහාට එක්කරගෙන එනකොට නම් හොඳටම බීලා හිටියේ. සිහිත් නැතිගානටයි හිටියෙ. ඇඟේ තැල්මයි තුවාලයි තියෙනවා. රණ්ඩුවකට මැදි වෙලා ගුටිකාලා කියලා තමයි මෙහෙට අරගෙන ආවේ. ප්‍රකාශයක් සටහන් කරගන්න කියලා පොලීසියෙනුත් මෙහාට ආවා. දැන් නම් ගොඩක් හොඳයි. තව දවසකින් දෙකකින් ටිකට් කපන්න පුළුවන් වෙයි.

එහෙනම් අපි යනවා නෝනා

හා හොඳයි.

සති කිහිපයකට පසු ලොකු ඉස්කෝලෙ මහත්තයාලගෙ ගෙදරදි මාලනීත් දොස්තර නෝනාත් නැවත හමුවෙයි.

මාලනී කොහොමද දැන් අර ලෙඩාට, තාමත් බොනවද?

ආරංචියේ හැටියට නම් එහෙම තමයි නෝනා.

ඒ කියන්නෙ බීමට ඇබ්බැහි උන කෙනෙක් ද?

සිරිල් කියන්නෙ නම් කාන්සිය, මහන්සිය නැතිවෙන්ඩ ජොලියට පොඩ්ඩක් ගන්නවා කියලා. මං හිතන්නෙ නෝනා සිරිල් බීමට ඇබ්බැහි වෙලා ඉන්නෙ.

සිරිල් බීමට ඇබ්බැහි වෙලා නම් අපිට පුළුවන් සිරිල්ට උදව් කරන්න. මාලනී කැමතිද ඒකට.

ඔව් නෝනා මම කැමතී. ඉතින් මම මොකද කරන්න ඕනෙ.

මාලනී අපි සිරිල්ට කවුන්සලින් ටිකක් කරලා බලමු. මම විශ්වවිද්‍යාලෙ ඉන්නකාලෙ කවුන්සලින් ඉගෙන ගත්තා. ඒ උනාට මට ඒක වැඩිය ප්‍රායෝගිකව යොදා ගන්න බැරිඋනා. ඉතින් මේක හොඳ අවස්ථාවක්. ඔයා ගිහින් සිරිල්ට කියන්ඩ මම ඇබ්බැහිවීම් ගැන පරීක්ෂණයක් කරනවා කැමතිනම් ඇවිත් තොරතුරු කියන්ඩ කියලා. හැබැයි බලකරන්ඩ යන්ඩ එපා.

සිරිල්ගෙ කොණ්ඩය හීනියට ක්‍රේල්ව පිහිටා ඇති අතර උරහිස් දෙක පළල්ව පිහිටා ඇත. ඔහුට ඉතා තියුණු විමසුම් සහගත නෙත් යුගලක් පිහිටා ඇත. පපුව ප්‍රදේශයේ සහ අත්වල සෘනව වැඩුන රෝම පිහිටා ඇත. මඟුල් ගෙවල්, මරණ ගෙවල්, ශ්‍රමදාන, පංසලේ කටයුතු ආදී පොදුවැඩවලදී තරුණයකු වශයෙන් ඔහුගේ සහයෝගය ගමට ඉතා හොඳින් ලැබේ.

කලින් කථාකරගත් පරිදි සිරිල් දොස්තර නෝනාගේ යෝජනාවට කැමැත්ත ප්‍රකාශකර මාලනීත් සමග දොස්තර නෝනා හමුවෙනු පිණිස ලොකු ඉස්කෝලෙ මහතාගේ නිවසට පැමිණෙයි. ඉන්පසු දොස්තර නෝනාත්, මාලනීත්, සිරිලුත්, තිදෙනාම බිම්මලේ හැඩැති තනි කනුවේ හට් එක තුළට පිවිසෙයි. දොස්තර නෝනා මුලින්ම වාඩි වී ඉන්පසුව සිරිල්ටත් වාඩිවීමට ආරාධනා කරයි. මේ අතර මාලනී දොස්තර නෝනාටත්, සිරිල්ටත් සමු දී තම නිවස බලා පිටත් වී යයි. දොස්තර නෝනා සිරිල් සමඟ කථාව අරඹමින්.

ඔයාට මතකද දවසක් ඔයා වැව ළඟ වාඩිවෙලා ඉන්න වෙලාවෙ, වැවට ගල් කැට විසිකරකර ඉන්නකොට වාහනයක් ඇවිල්ලා නතර කරලා කුඹුක්ගම ඉස්පිරිතාලෙට යන පාර ඇහුවා.

ඔව්

එදා තමයි මම මෙහාට ආව මුල්ම දවස. අපේ අප්පච්චි තමයි ඔයාගෙන් පාර ඇහුවෙ. ඔයා අපේ වාහනේ දිහා බලලා හිනාඋනා මතකද?

සිරිල් නිරුත්තරය.

සිරිල්ට තරමක් ලැජ්ජාමුසු හැඟීමක් ඇතිවූ අතර එයට හේතුව ඔහු එදා සිනාසුනේ දොස්තර නෝනා සමග වීමය. එය වැටහුණු දොස්තර නෝනා මදවේලාවක් නිහඬව සිට නැවතත් සිරිල්ගෙන් තොරතුරු විමසන්නට විය.

සිරිල්ට බීම ගැන මොකද හිතෙන්නෙ. ඔයාට හිතෙන විදියට මට කියන්ඩ.

ඉන්පසු සිරිල් දොස්තර නෝනාගෙන් මෙලෙස විමසන්නට විය.

නෝනා මත්ද්‍රව්‍ය ගත්තහම ඒකෙ සතුටක් තියෙනවද?

ඔව් සතුටක් තියනවා. ඒ වගේම ඇබ්බැහි වීමකුත් තියනවා.

ඒ උනාට වෛද්‍ය විද්‍යාවෙ කියන්නෙ මත්ද්‍රව්‍ය හොඳ නෑ කියලනෙ.

ඔව් ඒකත් මං පිළිගන්නවා.

එතකොට නෝනා සතුටක් තියෙනවා කීවෙ.

සතුටක් නැත්නම් සිරිල් මේවා මිනිස්සු පාවිච්චි කරයිද?

ඒ උනාට නෝනා සතුට තිබ්බට ඒකෙන් වෙන හානිය වැඩියි නේද?

සිරිල් හරියටම හරි. ඒක හරියට ඇඟේ ඉන්න මඳුරුවෙක් මරන්න තඩි පොල්ලකින් ගහනවා වගේ වැඩක්.

ඉතින් නෝනා ජීවත්වෙනකොට සතුට කියලා දේකුත් අවශ්‍යයි නේද?

ඔව් සතුට අවශ්‍යයි. නමුත් සතුට ලබාගන්ඩ ගිහිල්ලා වෙන හානිය වැඩී නම් ඒ සතුටින් වැඩක් නෑ නේද?

ඒ කියන්නෙ නෝනා පිළිගන්නවා හැම පුද්ගලයෙකුට සතුටු වීමේ ක්‍රමවේදයක් තිබීමේ අවශ්‍යතාවය.

ඔව් සිරිල් අපි සතුටු වෙනකොට කාන්සිය, මහන්සිය වගේ හැඟීම් යටපත්වෙනවා. ඒකනෙ පරණ කාලේ එකඑක වෘත්තීන්ට කාන්සිය, මහන්සිය නිවාගන්ඩ ජනකවි නිර්මාණය වෙලා තිබුනෙ. අනිත් එක සිරිල් අන්තරාකාරී නොවෙන විදියට මිනිස්සුන්ගෙ කාන්සිය, මහන්සිය, විඩාව අඩුකරගෙන ආශ්වාදයන් ලබන ආකාරය ගැන රජය විධිමත් ලෙස ජනතාව දැනුවත් කරන්න ඕනෙ. එහෙම දැනුවත් කරන එක ජනමාධ්‍යවලත් යුතුකමක්.

අන්තරාකාරී නොවෙන විදිහට කාන්සිය, මහන්සිය, විඩාව අඩුකරගන ආශ්වාදයන් ලබන ක්‍රමවේදයන් ගැන පාසල් විෂය මාලාවටත් ඇතුල් කළ යුතුයි. එහෙම කලාම නිසි පිළිවෙළකට යොමුවීම තුළින් ජනතාව වැරදි ආශ්වාද ජනක දේවල්වලට යොමුවෙන්ඩ තියෙන ඉඩකඩ අඩුවෙලා යනවා. එහෙම නැතුව ඖෂධ අවභාවිතය, මත්ද්‍රව්‍ය පාවිච්චිය පිළිබඳ නීති දැම්මටම,ඒවාට දඬුවම් දුන්නටම, සම්පූර්ණයෙන්ම ඒ දේවල් වළක්වන්න බෑ.

එතකොට නෝනා අන්තරාකාරී ක්‍රමවලට සතුටු වෙන අය ඒකෙන් හානියක් වෙනබවත් දැන දැන ඒකෙන් මිදෙන් නැත්තෙ ඇයි.

ඒකට මූලික හේතුවක් තමයි ඇබ්බැහි වීම. අනෙක් හේතුව තමයි අන්තරාකාරී නොවන විදිහට සතුට ලබන මාර්ගයක් හොයාගන නැති එක.

අන්තරාකාරී ලෙස සතුට ලබන පුද්ගලයෙකුට අන්තරාකාරී නොවන ලෙස සතුට ලබන මාර්ග තිබුනත් ඇයි ඒවට මාරුවෙනවා අඩු.

සිරිල් ඒ ප්‍රශ්නෙ ඇහුවට සිරිල්ට ගොඩක් ස්තුතියි. මම ගෙදර ඉදලා මෙහාට නවතින්න එනකොට මගෙ හිතේ වැඩි කැමැත්තක් තිබුණේ නෑ. නමුත් ටිකෙන් ටික හුරුඋනා.

අපිට මුහුදෙ පීනන්න ඕනෑනම් මුලින්ම මුහුද දකින්න ඕනෙ. ඊට පස්සෙ ටිකෙන් ටික වෙරළට හුරුවෙලා පියවරෙන් පියවර තමයි ඊළඟ කටයුතුවලට යොමු වෙන්න ඕනෙ.

දැන් සිරිල් කැමතිද එක පාරට කොළඹ ගිහිල්ලා නතර වෙන්න.

අපෝ නෑ නෝනා.

එතකොට සැරින් සැරේ කොළඹ ගිහිල්ලා දවස දෙක නතරවෙලා ටික ටික හුරුඋනානම් කොහොමද?

එහෙම හිතනකොට නම් ටිකක් හොඳයි කියලා හිතෙනවා.

සිරිල් මනෝ විද්‍යාවෙ තියනවා චර්යා හැඩගැස්වීමේ ප්‍රවේශය කියලා ක්‍රමයක්. (BEHAVIOUR THERAPY) අන්න ඒකෙන් කරන්නෙ නුහුරු දේකට පුද්ගලයෙක් ක්‍රමානුකූලව හුරුකිරීම. එතකොට අන්තරාකාරී ලෙස සතුට හොයන පුද්ගලයෙක් ඒකෙන් මුදවාගන්න ඒ වගේ මනෝවිද්‍යාත්මක ක්‍රම උපයෝගි කරගන්න පුළුවන්.

06 වැනි පරිච්ඡේදය

මාලනී තව සති දෙකකින් අපේ ගෙදරින් දානයක් දෙනවා මාලනීත් යං දානෙට සහභාගි වෙන්ඩ.

නෝනා අද නොවැම්බර් 20 එතකොට දානෙ තියෙන්නෙ දෙසැම්බර් 04 වෙනිදා

ෂා..... මාලනීට හොඳට ගණන් හදන්න පුළුවන්නෙ.

නෝනා මට ගණන්වලට D එකක් තියනවා.

එහෙනං මාලනී මං තව ගාණක් දෙන්නං හදන්න පුළුවන්ද?

හොඳයි නෝනා මං උත්සාහ කරලා බලන්නම්.

මාලනී හතරයි හතරයි එකතු උනාම කීයද?

මාලනී මදක් සිනාසෙමින් උත්තරේ අට බව ප්‍රකාශ කරයි.

මම කියනවා මාලනී උත්තරේ අටටත් වැඩිවෙන්න පුළුවන් කියලා.

එතකොට මාලනී අටක් තියන තැනකින් හතරක් අඩුඋනාම කීයද?

මං දන්න විදියට නම් නෝනා උත්තරේ හතරයි.

මම කියනවා මාලනී උත්තරේ හතරටත් වඩා අඩුවෙන්න පුලුවන් කියලා.

මම නම් නෝනා ඔය කියන ගණන් ක්‍රමය ගැන දන්නෙ නෑ. අනේ නෝනා මටත් කියලා දෙන්ඩකො.

මාලනී මමත් මේ ක්‍රමය ගැන හරියට හොයලා බලලා නෑ. නමුත් මේකෙ මොකක් හරි ඇත්තක් ඇති කියලා මට හිතෙනවා.

මේ ගණන් ක්‍රමය බල පැවැත්වෙන්නෙ චිත්ත බලයයි එකමුතුකමයි සම්බන්ධවයි. සමගිය බලය වේ කියලත් කථාවක් තියෙනවනෙ. ඒ කියන්නෙ සාමාන්‍ය ගණන් ක්‍රමේදී හතර දෙනෙක් ඉන්න තැනකට තව හතර දෙනෙක්

එකතු උනාම අට දෙනෙකුගේ බලයක් තියෙනවා. නමුත් ඒ අටට අමතරව අපි අටදෙනෙක් එකට එකතුවෙලා ඉන්නවා කියන හැඟීමකුත් තියෙනවා. ඒකත් ශක්තියක් බලයක් වෙනවා. ඒක වෙන්න ඇති මනෝ විද්‍යාවෙදි කියනවා ඇත්තෙ හතරයි හතරයි එකතු උනාම අටයි නෙවෙයි ඊට වැඩියි කියලා.

අනිත් එකේදි, සමාන්‍ය ක්‍රමේදී අටක් තියෙන තැනකින් හතරක් අඩුකලාම උත්තරේ හතරයි. නමුත් අපි අටදෙනෙක් ඉන්න තැනකින් හතරදෙනෙක් අඩු උනාම, අඩු උනානෙ කියන හැඟීමකුත් තියෙනවා. ඒ නිසා ඒ හැඟීමත් එක්ක චිත්ත බලය සහ සමගි බලයත් අඩුවෙන නිසා උත්තරේ හතරටත් වඩා අඩුවෙන්න පුළුවන්. මම මේ කතාව නිකං කීවෙ. මේක මම අහපු කතාවක්.

ඒ උනාට නෝනා මටත් හිතෙනවා ඒ ගණිත ක්‍රමේ මොකක් හරි ඇත්තක් ඇති කියලා.

ඒ මොකද මාලනී.

නෝනා අපි තනියම ඉන්නකොට අඳුරන කෙනෙක් එතැනට ආවම හිතට පුදුම හයියක් දැනෙනවා. ඒ වගේම අඳුරන කෙනෙක් අපි ළඟ ඉඳලා යනකොට හිතේ ගැම්ම ටිකක් අඩුවෙනවා. ඒකයි මම එහෙම කීවෙ.

නෝනා කොහෙද දානෙ තියෙන්නෙ.

තලගල ආරඤ්ඤයේ, අපේ අප්පච්චිගෙ උපන් දිනේට තමයි දානෙ දෙන්නෙ. මම දෙසැම්බර් තුන්වෙනිදා යනවා. මම කැමතියි මාලනීත් එනවනම්. මාලනී කල්පනා කරල බලලා කියන්ඩකො.

මම ගෙදරින් අහලා බලලා පස්සෙ කියන්නම් නෝනා.

දොස්තර නොනාගේ අප්පච්චිගේ උපන් දිනයට දෙන දානයට හොරණට දොස්තර නෝනා සමග යෑමට මාලනීට නිවසින් අවසර ලැබෙයි. ඒ අනුව දානය දීමට කලින් දින හොරණට යෑමට දොස්තර නෝනාත් මාලනීත් කුරුණෑගලට පැමිණෙයි. එතැන් සිට ඔවුන් කොළඹ දක්වා ගමන් කරන්නේ වායුසමනය කල සුඛෝපභෝගී බස්රථයකිනි. දෙදෙනාම වාඩිවී සිටින්නේ එකම අසුනකය. මාලනී දොස්තර නෝනාගෙන් තලගල ආරඤ්ඤය ගැන විස්තර විමසයි.

දොස්තර නෝනා ද මාලනීට ඒ ගැන විස්තර ප්‍රකාශ කරයි. කථාව දිගින් දිගටම යන විට මාලනීට සිල්රැකීම පිළිබඳ ප්‍රශ්න ඇතිවෙයි.

දැං නෝනා අපි පන්සිල් රකින එක අපේ හිත තදකරගන ඉඳීමක් නෙවෙයිද?

මාලනී මම දකින විදිහට, මාලනී උදාහරණයක් විදිහට මෙහෙම හිතන්ඩකෝ. අපි කෙනෙකුගෙ ගෙදරට නිතර නිතර ආශ්‍රයට යනකොට එයා අපිට අකමැති නම් එයා අපිට සතුරුකම් නොකලත් ඒ බව අපට හැඟී ගියොත් අපිට ආයේ ඒ ගෙදරට යන්න හිතදෙන්නෙ නෑ නේද? දෙන්ඩ අකමැති කෙනෙකුගෙන් ණය මුදලක් ඉල්ලා ගන්ඩ ඇහුවොත් එයා ඒක දෙන්ඩ අකමැති බව අපට හැඟීගියොත් ඒක නැවත ඉල්ලන්ඩ හිතෙන්නෙ නෑ නේද?

කලින් කියපු, අපි යනවට අකැමැති පුද්ගලයගෙ ගෙදරට අපි යනකොට අපිව ප්‍රතික්ෂේප කිරීම් තිබුණ නිසා නැවත ඒ ගෙදරට යන්ඩ අපේ හිත තුළ සිතිවිලි ගලා ඒම අඩුවෙනවා. අන්තිමේදී ඒ ගෙදරට යන සිතිවිලි පැමිණීම නැතිවෙලා යනවා.

ණයට මුදල් ඉල්ලාගන්ඩ යන විට නිතර නිතර අපිට ණයදීම ප්‍රතික්ෂේප කළොත් ඒ පුද්ගලයගෙන් ණයට මුදල් ලබාගැනීමට සිතිවිලි ගලා ඒම අඩුවෙනවා. ණය නොදී ඔහු අපිව දිගටම ප්‍රතික්ෂේප කළොත් ඒ පුද්ගලයගෙන් ණයට මුදල් ගැනීමට අපේ හිත තුළ ඇතිවෙන සිතුවිලි ගලා ඒම සම්පූර්ණයෙන්ම නැතිවෙනවා. අපේ හිතට එන සිතුවිලි කුමන ආකාරයකින් හෝ ප්‍රතික්ෂේප කිරීම් තුළින් එම සිතිවිලි නැවත පැමිණීම අඩු වී යන බව මේකෙන් පැහැදිලියි.

බෞද්ධාගමේ සිල් රැකීමේදීත් හිත තුළ ඔය ක්‍රියාදාමය සිදු වෙලා වැරදි සිතිවිලි ඒම නැතිවෙන බව පේනවා. සතුන් නොමරන සිල්පදය සමාදන් උනාම සතුන් මැරීම සම්බන්ධයෙන් සිතිවිලි ඇතිකිරීම වැඩක් නැති බව අපේ හිත හිතනවා. ඒ නිසා සතුන් මැරීම සම්බන්ධ සැලසුම්, චිත්තරූප මැවීම් අඩු වී නැති වී යනවා.

සොරකම් නොකරන සිල්පදය සමාදන් උනාම ඒ සම්බන්ධයෙන් සිතිවිලි ඇති කිරීම වැඩක් නැති බව අපේ හිත හිතනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් සැලසුම්, චිත්තරූප මැවීම් අඩු වී නැති වී යනවා.

කාමය වරදවා හැසිරීම නොකරන සිල්පදය සමාදන් උනාම ඒ සම්බන්ධයෙන් සිතුවිලි ඇතිකිරීම වැඩක් නැති බව අපේ හිත හිතනවා. ඒ නිසා ඒ සම්බන්ධ සැලසුම්, චිත්ත රූප මැවීම් අඩු වී නැති වී යනවා.

මාලනී අනික් සිල්පද වලටත් ඔය විදිහටම තමයි බලපාන්නෙ. සිල්පද හිතින්වත් කඩන්න හොඳ නෑ. අපි සමාදන් වෙන සිල්පදය හිතින් කඩන්න ගියොත් ඒකට අදාළ දේවල් දකිනකොට, ඇහෙනකොට, දැනෙනකොට, හිතෙනකොට, ඒක කැඩීමට අදාළ තව තවත් අදහස් හා සිතුවිලි අපිට හිතින් දෙනවා. හිතින් සිල්පදය නොකඩන විට එය කැඩීමට අදාළව අදහස් හා සිතුවිලි දීමෙන් වැඩක් නැති බව හිතන අපේ හිත එවැනි අදහස් හා සිතුවිලි දීමෙන් වැළකී සිටිනවා.

මම දකින විදිහට මාලනී සිල් රකින කොට ඒක පීඩනයක් බවට පත්වෙන්නෙ හිතෙන් නොරැක ක්‍රියාවෙන් පමණක් කිරීමට යෑමෙන්. ඒක හින්දා හිතෙනුයි කයිනුයි යන දෙකෙන්ම අදාළ සීලය ආරක්ෂා කරන්න ඕනෙ. නැත්නම් සිල්රැකීම පීඩනයක් වෙන්න පුළුවන්.

දැන් ඔයාගෙ ප්‍රශ්නෙට උත්තරයක් ලැබුනද මාලනී.

මාලනී මද සිනාවක් පාමින් හිසවනන්නට විය.

07 වැනි පරිච්ඡේදය

ආ..... සර් එන්ඩ එන්ඩ හුඟක් කාලෙකින් හම්බ උනෙ එලෙස පැවසුවේ ලොකු ඉස්කෝලෙ මහතායි.

මම මේ ළඟට ආපු ගමන්, මට හිතුනා ලොකු සර්ව බලලා යන්ඩ ඕනෙ කියලා. එලෙස පැවසුවේ කුඹුක්ගම පාසලේ අලුත් ප්‍රින්සිපල් මහතායි.

වාඩිවෙන්ඩ මම මැගිලින්ට තේ එකක් හදාගෙන එන්ඩ කියන්නම්.

සර් මේ දවස්වල මොකද කරන්නෙ. එලෙස ඇසුවේ කුඹුක්ගම පාසලේ අලුත් ප්‍රින්සිපල් මහතායි.

පෙරේදා පංසලේ බණ මඩුව හදන්ඩ ආධාර හොයාගන්ඩ සල්පිලක් තිබ්බා ඉතින් ඒ වැඩවලට සහභාගි උනා.

එක අතකට සර් අපේ මේ සමහර කට්ටිය කරන වැඩත් සල්පිලක් වගේ කියලා හිතෙනවා.

ඒ මොකද සර් එහෙම කීවෙ. එලෙස ඇසුවේ ලොකු ඉස්කෝලෙ මහතාය.

දැං සමහර තැන්වල එක ගෙදරක ගෑනු කෙනෙක් මොනවා හරි ගත්තොත් ඊට වැඩිය දෙයක් අල්ලපු ගෙදර ගෑනු කෙනාටත් ගන්ඩ ඕනෙ. එක පිරිමි කෙනෙක් වාහනයක් ගත්තොත් අල්ලපු ගෙදර පිරිමි කෙනාටත් ඊට වැඩිය ලොකු වටින වාහනයක් ගන්ඩ ඕනෙ. අල්ලපු ගෙදර ළමයට වැඩිය අපේ ළමයා වැඩිපුර ලකුණු ගන්ඩ ඕනෙ, කියන සංකල්පය තමා සමහර මනුස්සයෝ තුළ තියෙන්නෙ. අන්තිමේට තරග කරන්න ගිහිල්ලා හිතුත් තලාගෙන දුකට පත්වෙලා අමාරුවෙ වැටෙනවා. ඒකයි සර් මම කීවේ සමහර කට්ටිය කරන වැඩ සල්පිලක් වගේ කියලා.

ඔතනදි ගොඩක් දෙනෙක් කරන්නෙ සාපේක්ෂවාදීව හිතලා දුකට පත්වෙන එක. අසවලා මට වඩා ලස්සනයි. ඒ ගොල්ලන්ගෙ ගෙට වටා අපේ ගේ පොඩියි. ඒගොල්ලන්ට තියෙන්නෙ මිල අධික කාර්එකක්. අපිට තියෙන්නෙ බාල වර්ගයේ කාර්එකක්. ඒගොල්ලෝ ගමන් ගියාම ලොකු ලොකු හෝටල්වලින් කන්නෙ. අපි ගමනක් ගියාම සාමාන්‍ය හෝටලයකින් කන්නෙ. ඒගොල්ලන්ට ලොකු ලොකු සල්ලිකාර හිතවත් අය ඉන්නවා. අපිට ඉන්නෙ දුප්පත් අය කියලා. සාපේක්ෂවාදීව හිතලා දුක්වෙනවා. එලෙස පැවැසුවේ ලොකු ඉස්කෝලෙ මහතායි.

එතකොට සර් කලින් කීව කරණා ගැනම සාපේක්ෂවාදීව හිතලා සතුටු වෙන්නත් පුළුවන් නේද? ඒ කියන්නෙ මට වඩා ලස්සන අඩු අය ලෝකෙ කොච්චර ඉන්නවද, ඒ අතින් බලනකොට මම හොඳයි. අපිට මේ වගේ ගෙයක් වත් තියෙනවා නමුත් අපිට තරම්වත් පහසුකම් නැති ගෙවල් තියෙන අය

කොච්චර ඉන්නවද, අපේ කාර් එකට වඩා මිල අඩු කාර් තව කොච්චර තියනවද, අපි ගමනක් ගියාම මේ වගේ හෝටලයකින්වත් කනවා. මීට වැඩිය පොඩි කඩවල්වලින් කන අය තව කොච්චර ඉන්නවද කියලා සාපේක්ෂවාදීව හිතලා සතුටු වීමේ හැකියාවකුත් තියෙනවා නේද, ඉතින් සර් ඔය විදිහට බලනකොට සතුට දුක සාපේක්ෂවාදී ද කියලා හිතෙනවා. මොකද ඒක ඇතිවෙන්නෙ අපි හිතන ආකාරයටනෙ.

ලොකු සර් මට මෙහෙමත් හිතෙනවා අපි බොහොම දෙනෙක් අතරේ හොඳ යහපත් හැකියාවල් හැංගිලා තියෙනවා. නමුත් අපි අනුන්ගෙ හැකියාවල් දැකලා අපට ඒ වගේ හැකියාවල් නෑ කියලා දුක්වෙනවා. අපිට තියෙන හැකියාවල් මොනවද කියලා හොයලා බලලා ඒවා එළියට ගන්නෙ නැතුව. ඒ වගේම තමයි නැති දේවල් ගැන දුක් නොවී තියෙන දේ ගැන සතුටු වෙන්න ඕනෙ.

අලුත් ඉස්කෝලෙ මහත්තයා කීවේ බොහොම වැදගත් කාරනා. ඇත්තටම මිනිස්සු ඒ ගැන හිතනවා නම් ගොඩක් හොඳයි.

ලොකු ඉස්කෝලෙ මහතාගේ තේ පැන් සංග්‍රහය භුක්ති විඳීමෙන් අනතුරුව අලුත් ඉස්කෝලෙ මහතා ලොකු ඉස්කෝලෙ මහතාට සමු දී පිටත් වනවාත් සමගම පැමිණියේ විශ්‍රාමලත් විදුලිබල මණ්ඩල නිලධාරියෙකු වන රංබංඩා මහතායි.

ආ..... රංබංඩා මහත්තයා එන්ඩ එන්ඩ ඇවිත් වාඩිවෙන්ඩ.

රංබංඩා මහත්තයා වාඩිවීමට කලින් පැපොල් ගෙඩි දෙකක් සහිත මල්ලක් ලොකු ඉස්කෝලෙ මහත්තයා අතට දෙන්නට විය.

බොහොම ස්තුතියි මහත්තයා.

ඔය අපේ වත්තෙ මම හදපු දේශීය පැපොල් ගස් වල ගෙඩි.

එහෙමනම් තවත් ගොඩක් හොඳයි. ලොකු ඉස්කෝලෙ මහත්තයා පිළිතුරු දෙන්නට විය.

දැං බලන්ඩ ඉස්කෝලෙ මහත්තයා. අස්වැන්න වැඩියි ප්‍රතිඵලත් ඉක්මන් කීවට, අලුතෙන් හඳුන්වලා දීලා තියෙන එළවළු, පලතුරු වගේම සමහර ගස්වලත් පරණ එළවළු පලතුරුවලත් සෑහෙන වෙනසක් තියනවා. අස්වැන්න වැඩියි ප්‍රතිඵල ඉක්මන් කියන දේ මම නම් දකින්නෙ රෑවැට්ටිල්ලක් එහෙම නැත්නම් රෑවටීමක් විදිහට. මොකද සොබාදහමෙන් තමයි අපට නියම දේ දෙන්නෙ. ඒකට පිටින් යන්න ගියොත් පාඩුවිඳින්න සිද්ධවෙනවා.

ඉක්මන් කෙටියි කියලා ජනවහරේ කතාවකුත් තියෙනවනෙ. අපිට කොච්චර හදිස්සි තිබුණත් කන්නෙන් පිටකෙරෙන වගාවල අස්වැන්න අඩුයි. සොබාවික පැපොල්වලට වඩා අඩු කාලයකින් අස්වැන්න නෙලාගන්න අලුත් පැපොල් ප්‍රභේදවල රසගුණවල වෙනසක් තියනවා. පරණ වර්ගෙ වීවල අස්වැන්න අඩුයි කීවට අලුත් වීවල නැති ගොඩක් හොඳ ගුණාංග පරණ වීවල තියනවා. කොටින්ම කියනවා නම් අලුත් බෝගවල අස්වැන්න ලැබීම ඉක්මන් උනාට, අස්වැන්න වැඩි උනාට බෝගවල රසවැඩිකමින්, ගුණවැඩිකමින්, පහසුවෙන් හදාගැනීමට හැකිවීමෙන්, තෙල් පොහොර භාවිතය අවමවීමෙන්, විදෙස් වලට ඇදී යන ආදායම් ගැන බැලීමෙන් අපට ගැළපෙන්නෙ පරණ දේවල්. ඔය විදිහට බලනකොට ඉස්කෝලෙ මහත්තයා අපි සොබාධර්මයේ වේගයට, රිද්මයට, රටාවට විරුද්ධව යනකොට අපට ලැබෙන ප්‍රයෝජන අඩුයි. හානි වැඩියි.

දැං බලන්ඩ රංබංඩා මහත්තයා ඉක්මනට හැදීමට හිතාගෙන උයන මාලුපිනිවල රස අඩුයි. ටික ටික ගින්දර දාලා උයන මාළුපිනිවල රස වැඩියි. එතකොට වෙනත් ක්‍රමවලින් පුච්චන පාන්වලට වැඩිය දර පෝරණු පාන්වලට වැඩි දෙනා කැමැතියි. ඒ අනික් ක්‍රමවලට පුච්චන පාන්වලට වැඩිය රස වැඩි නිසා. එතකොට ක්ෂණික ආහාරවල, බෙහෙත්වල අඩුපාඩු තියෙනවා. ඒවගෙ රසමට්ටම් ගැනත් ගුණ මට්ටම් ගැනත් සෑහීමකට පත්වෙන්ඩ අමාරුයි. සොබාදහමෙ වේගයට, සොබාදහමට අනුකූලව උයන ආහාරවල රසගුණ දෙකම වැඩියි.

අපි ආහාරයක් ගන්නකොට උනත් ටිකෙන්ටික හෙමිහිට ගන්නකොට ඒකෙ නියම රසය විඳගන්න පුළුවන්. සොබාදහමෙ රිද්ම රටාවෙන් මිදී අධිවේගි රටාවකට යෑම තුළින් සොබාදහමේ රස විඳගන්ඩ බැරිවෙනවා.

සොබාවික පරිසරයක ආශ්වාදය අපට හදිස්සිය තිබුණු පලියට විඳගන්න බෑ. ඒක යම්කිසි කාලයක් යොදාගන සන්සුන් මනසකින් කරන්ඩ ඕනෙ වැඩක්. ඒ විදිහට බලනකොට හදිසියේ අධිවේගීව දිවීම ප්‍රතිඵල රහිත වැඩක්.

රංබංඩා මහත්තයා සිංදුවක් අහනකොටත් හදිස්සියේ දුවදුවා සිංදුව අහන්ඩ ගියොත් ඒකෙ නියම රස විඳගන්ඩ බෑ. සිංදුවක් අහනකොටත් අපි ඒකට කාලයක් වෙන්කරගන ඇහුවොත් තමයි ඒකෙ නියම රස විඳගන්ඩ ලැබෙන්නෙ. අපිට හදිස්සිය තිබුනු පලියට සොබාදහම අපිට රසාස්වාදය ලබාදෙන්නෙ නෑ. අපි සොබාදහමේ රිද්මයට, රටාවට, වේගයට අනිවාර්යෙන්ම අනුගත විය යුතුයි.

ඒ වගේම තමයි ලොකු ඉස්කෝලෙ මහත්තයා අපි සොබාදහමට රිදවන්ඩ ගියොත්, පොදු දේවල්වලට හානි කරන්ඩ ගියොත්, පොදු දේපලවලට හානි කරන්ඩ ගියොත් ඒක අපිටම කරගන්න හානියක්.

මේ කථාවෙ ඇත්ත, බොරු මොනවද කියන්න මම දන්නෙ නෑ. ඒ තමයි ලංකාවෙ අලි 1500 ක් විතර විනෝදෙට මරපු සුද්දෙක්ගෙ සොහොනට අදටත් හෙනගහනවා කියන කථාව.

රංබංඩා මහත්තයා ඔය කථාව මමත් අහලා තියෙනවා.

එතකොට ඉස්කෝලෙ මහත්තයා ජපානය අද හොඳ දියුණු රටක්. ඔවුන් අනුන්ට සහ සොබාදහමට ගරු කරනවා. කථාකරන කොටත් අනිත් කෙනාට ආචාරශීලීවයි කතා කරන්නෙ.

අපේ සිංහල අයත් ඉස්සර හොඳ දියුණුවට හිටියා. අපේ අය ආගන්තුක සත්කාරයට ලෝකෙ ප්‍රසිද්ධයි. ගහකින් බෙත්තිකක් අරගත්තත් වැඳලා තමයි අරගත්තෙ. ඒ තරමට අනිත් අයට සොබාදහමට ගරුකරා. ඒ කාලේ ඒ තරම් දියුණුවට පත්වෙලා ඉන්ඩ ඇත්තෙ අනික් අයටයි, සොබාදහමටයි ගරු කරපු නිසා වෙන්න ඇති. දැන් ඒ ගතිගුණ අඩු නිසා ඒක අපේ පරිහානියට බලපෑවා වෙන්නත් පුළුවන්.

08 වැනි පරිච්ඡේදය

දොස්තර නෝනා වැඩට යෑමට පිටත් වීමට සිටින අවස්ථාවකදී මාලනී දොස්තර නෝනා හමුවීමට ඉස්කෝලෙ මහතාගේ නිවසට පැමිණෙයි.

නෝනා වැඩට යන්ඩ ද?

ඔව් මාලනී මම මාලනීට එන්ඩ කීවෙ මට ලොකු ආසාවක් තියෙනවා අපේ පාරෙ චුට්ටක් දුර ඉස්සරහට ගියාම පේන්න තියෙන කන්දෙ ගලට නැගලා අවට පරිසරය බලන්න.

බැලුන් ගලට ද?

ඒකට බැලුන්ගල කියලද කියන්නෙ.

ඔව් නෝනා, එහෙමනම් අපි නෝනට නිවාඩු වෙලාවක ගමන ලෑස්ති කරගම්මු. අපි ගමනට සිරිල්වත් එක්කරගම්මු. මොකද සිරිල් ඔය පැත්ත ගැන හොඳට දන්නවා.

එහෙමනම් මාලනී මම දැන් වැඩට යනවා මම නිවාඩු වෙලාවක කියන්නම්. මාලනී ගමන ගැන සිරිල්ටත් කියලා තියන්ඩ.

දින කීපයකට පසු කලින් කතා කරගත් පරිදි සිරිල් සමග තිදෙනාම බැලුන් ගලට යෑමට සැරසෙයි. දොස්තර නෝනා පිටේ එල්ලන බෑගයක්ද, මාලනී පිටේ එල්ලන බෑගයක් ද රැගෙන ගමනට අවශ්‍ය අඩුම කුඩුම රැගෙන යයි.

ටිකදුරක් යන විට සිරිල් කතාවට මුල පුරමින් අල්ලපු ගමේ සිටින මරුසිරා ගැන මාලනීගෙන් අසයි.

ඈ මාලනී මරුසිරා මිනීමැරුම් නඩුවෙන් නිදහස් වුණාලු නේද?

එහෙම තමයි ආරංචිය. මිනීමැරුම සිද්ධ වුණේ හදිසිකෝපෙන් කියලා උසාවියෙන් තීරණය කරපු නිසා මරුසිරා නිදහස් උනා කියලා තමයි කියන්නෙ.

කවුද මාලනී මරුසිරා

දොස්තර නෝනා මරුසිරා ගැන විමසන්නට විය.

මේ..... නෝනා අල්ලපු ගමේ ඉන්න චණ්ඩියෙක්. වැඩිපුර වැරදි වැඩ තමයි කරන්නෙ.

ඔයාලා හිතනවද හදිසි කෝපය එහෙම නැත්තම් ක්ෂණික කෝපය කියලා දෙයක් තියෙනවා කියලා. මම නම් දකින්නෙ හදිසි කෝපය එහෙම නැත්තං ක්ෂණික කෝපය කියන්නෙ මිනීමරුවෙකුට නීතියෙන් නිදහස් වෙලා යන්න තියෙන සිදුරක්.

ඇයි නෝනා එහෙම කීවෙ. මිනිස්සුන්ට හදිසි කෝපත් ඇතිවෙනවනෙ.

එලෙස කීවේ සිරිල්ය.

සිරිල් නීතියේදි කෙනෙකුට හදිසි කෝපය නිසා සිදු වූ පහරදීමක්, මිනීමැරුමක් කියලා නීතිමය වශයෙන් සහනයක් ලබාදෙනවා. මම නම් හිතන්නෙ ඒක නිවැරදි දෙයක් නෙවෙයි කියලා. මොකද නීතිමය වශයෙන් සහනයක් ලැබුණා කියන්නෙ ඒක මිනිසුන්ගෙ හිත් තුළ තව තවත් වැරදි ආකල්ප ඇතිවෙන්ඩ හේතුවක් වෙන්ඩ පුලුවන්. මොකද එක පාරට (ක්ෂණිකව) හිත තුළ තිබෙන ආකල්පයක් ක්‍රියාවට නැංවෙන්නෙ නෑ. මුලින්ම ඒක හිත ඇතුළෙ ක්‍රියාත්මක වෙනවා. උදාහරණයක් විදිහට හදිසි මිනීමැරුමක් නම් මරණයට ලක්වූ පුද්ගලයා සම්බන්ධයෙන් නොවුණත් වෙනත් කෙනෙක් ගැන හරි මැරීම සම්බන්ධයෙන් හිතේ සිතිවිලි ක්‍රියාත්මක වෙනවා. ඊළඟට ඒවා කටින් පිටවෙනවා. තව කෙනෙකුගෙ වැරැද්දක් දැකලා කියනවා "මරන්ඩ තියෙන්නෙ" නැත්නම් ඔහුම කියනවා "මම නම් මරනවා" කියලා. ඉතින් ඔයවගේ කියවෙන අවස්ථා තියනවා.

පහරදීම්, මිනීමැරුම් ගැන කටින් පිටවෙන්නෙ හිතින් මිනීමැරීම්, පහරදීම් සිදුඋනාට පස්සෙ. ක්‍රියාවෙන් මිනීමැරීම්, පහරදීම් සිදුවෙන්නෙ කටින් බොහෝවිට මිනීමැරීම්, පහරදීම් පිටඋනාට පස්සෙ. එහෙම බලනකොට ක්ෂණික කෝපය නිසා පහරදීමක්වත් මිනීමැරුමක්වත් සිද්ද වෙන්නෙ නෑ.

පළපුරුදු රියදුරු මහත්තයෙක් හදිසි අවස්ථාවකදි ක්ෂණිකව බ්‍රේක් ගහනවා. ඒක වෙන්නෙ එයාටත් නොදැනීමයි. එහෙම වෙන්නෙ එයා ලබලා තියන පුහුණුව නිසාමයි. ඒක ක්ෂණිකව සිදු උනා කීවට ක්ෂණිකව උනේ කලින් ලබලා තියන පුහුණුව නිසාමයි. ක්ෂණික මිනිමැරුමක් කීවට, ක්ෂණික පහරදීමක් කීවට කලින් අපේ හිත තුළ නොදැනුවත් නොසැලකිල්ල මත සිදුවුනු පුහුණු විදිහට ඒවත් ගන්න පුළුවන්. එහෙම බලනකොට ක්ෂණික කෝපයට පහරදීමටවත්, ක්ෂණික කෝපයට මිනීමැරීමටත් නීතිමය වශයෙන් සහනයක් ලබා දිය යුතුද යන්න නීතිවේදීන් විසින් සිතා බැලිය යුතු කරුණක්.

දැන් නෝනා ඔය විදිහට බලනකොට මේක හිතේ ඇතිවෙන සටනක් කියලා මට හිතෙනවා. එතකොට නෝනා කොහොමද අපි හිතේ ඇතිවෙන සටනක් නතරකර ගන්නෙ.

එසේ දොස්තර නෝනාගෙන් ප්‍රශ්නයක් ඇසුවේ සිරිල්ය.

අපි ගොඩක් දෙනෙක් තුළ තවත් අයත් එක්ක හිතේ ඇතිවෙන සටන් තියෙන්න පුළුවන්. නමුත් ඒක පීඩනයක් ගෙනදෙන බව නොතේරෙන අවස්ථා තියනවා. සමහරවිට තේරෙන අවස්ථාත් තියෙනවා.

වාක් සංග්‍රාම, ආයුධවලින් කරන පහරදීම්, අතින් පයින් පහරදීම්, උපක්‍රමශීලී ගැට වගේ ගොඩක් දේවල් සිතින් කරන අභ්‍යන්තර යුද්ධවලදි කරනවා. සැබෑ ලෝකෙදි තව කෙනෙක් එක්ක කරන සටනකදි අපි පහරවල් වැළැක්වීම් නොකළොත් අපිට ගුටිකන්ඩ පවා සිද්ධ වෙනවා. සමහරවිට ඒකෙන් ශරීරයට හානිවෙන්නත් පුළුවන්. නමුත් අභ්‍යන්තරව සිත තුළ සිදුවන සටනකදි අපි කොච්චර ගුටිකෑවත් ඇඟට හානි වෙන්නෙ නෑ. අභ්‍යන්තර යුද්ධයකදි අපිට අනිත් පාර්ශ්වය එක්ක යුද්ධයට නොගිහින් ඉන්නත් පුළුවන්. නමුත් අපි ගොඩක් වෙලාවට කරන්නෙ අනික් පාර්ශවය එක්ක යුද්ධයට යන එක, ගහගන්න එක, බැනගන්න එක, විරුද්ධවාදියාට නපුරක් වේවායි පතන එක.

සිත තුළ සිදුවන අභ්‍යන්තර සටනකදී ප්‍රතිපාර්ශ්වය අපේ ළඟට එන්නෙ අපේ සිතිවිලි හරහා. අපි කොච්චර අභ්‍යන්තර යුද්ධ කරත් ඒවා ඉවරයක් නම් කරන්ඩ අමාරුයි. අපේ ප්‍රතිපාර්ශ්වය සිතිවිලි හරහා අපේ හිත ඇතුළට ඇවිත් අපිත් එක්ක සටන් කරනවා.

මේකෙදි එකක් කියන්ඩ ඕනෙ. හිත ඇතුළේ ඇතිවන අභ්‍යන්තර යුද්ධ වලදි අපි යුද්ධයට නොගියොත් සිතිවිලි හරහා එන ප්‍රතිපාර්ශ්වය ටික ටික යුද්ධයට ඒම අඩුකරනවා. මේකෙදි අපට නොදැනීම ප්‍රතිපාර්ශ්වය යුද්ධයට පැමිණීමත් අපට නොදැනීම අපි යුද්ධයට පෙළඹීමත් වළක්වාගන්ඩ සිහියෙන් යුතුව කටයුතු කරන්න වෙනවා.

දිගින් දිගටම ප්‍රතිපාර්ශ්වය සිතිවිලි හරහා යුද්ධයට ආවත් අපි සිතිවිලි හරහා යුද්ධයට නොයන විට ප්‍රතිපාර්ශ්වය සිතිවිලි හරහා යුද්ධයට පැමිණීම අඩුකරන බැවින්, ඒ මගින් හිතේ සතුට සැනසුම පවත්වාගන යන්න පුළුවන් බව පැහැදිලියි.

අපි දැන් හිතමුකො කාන්තාවකගෙන් පිරිමියෙකුට හරි පිරිමියෙකුගෙන් කාන්තාවකට හරි මොකක් හරි හේතුවක් නිසා කැමැත්ත ඇති වෙන හැඟීමක් ලැබුනා කියලා. එතකොට ඒ හරහා සිතිවිලි ගලාගෙන එන්ඩ පටන් ගන්නවා. ඒ එන සිතිවිලි එක්ක අපිත් ඇලීගෙන කටයුතු කරන්ඩ ගියොත් තව තවත් ඒ වගේ සිතිවිලි ගලාගෙන එන්ඩ පටන් ගන්නවා. ඒ ගැනත් අපි මුලින් කතා කරපු අභ්‍යන්තර ගැටුම් ආකාරයටමයි හිතන්ඩ ඕනෙ. කොයිතරම් විරුද්ධ ලිංගිකයන් සිතිවිලි හරහා අපේ හිත තුළට පැමිණියත්, ආශ්‍රය කරන්ඩ උත්සාහ කළත් අපි ඒ ක්‍රියාවලට අනුබල නොදෙනවා නම් සිතිවිලි ආකාරයෙන් විරුද්ධ ලිංගිකයන් පැමිණීම අඩු වී යනවා. සමහර අවස්ථාවලදී අපට නොදැනීම සිතිවිලි ආකාරයෙන් විරුද්ධ ලිංගිකයන් පැමිණීමත් අපට නොදැනීම අපි ඔවුන් සමග ආශ්‍රයට පෙළඹීමත් සිදුවෙනවා. එහෙම වෙන එක වලක්වා ගන්න සිහියෙන් යුතුව කටයුතු කරන්න සිද්ධ වෙනවා.

සැබෑ ලෝකෙදි කවුරු හරි මොනවා හරි හේතුවක් නිසා ආශ්‍රය කරන්ඩ බැරිඋනොත් එයත් එක්ක අභ්‍යන්තර ආශ්‍රයක් තිබුනොත් ඒක හිතට පීඩනයක් වෙන්න පුළුවන්.

එහෙම තත්ත්ව වළක්වාගන්ඩ ඕනෑ නම් අදාළ අය හිත ඇතුළෙනුත් ආශ්‍රය කිරීම නතර කරන්න සිද්ධ වෙනවා. එතකොට අදාළ අය සැබෑ ලෝකෙදි දුටුවත් හිතට පීඩනයක් ඇති වීම වළක්වාගන්න පුළුවන්.

ඉහත කී මූලධර්ම දොස්තර නෝනා විස්තර කර අවසන් වන විට සිරිල් මාලනීගේ මුන දෙස බලා මෙලෙස ප්‍රකාශ කරන්නට විය. "ඒක තමා කෙල්ලො දිහා මනුස්සකමට බැලුවත්, කෙල්ලො ගණන් උස්සන්නෙ, කොල්ලන්ට වැරදි ආකල්ප ඇති වෙයි කියලා හිතාගෙන වෙන්න ඇති" එය අසා සිටි දොස්තර නෝනාට ද මද සිනා පහළ විය.

ඒක නෙමෙයි මාලනී අපි ටිකක් වාඩි වෙලා ඉදලා යමුද?

තිදෙනාම අසල තිබුණු ගසක් යටට වී වාඩිවී ගිමන් හරින්නට විය. ඒ අතර මාලනීගේ බෑගය ඇර බෑගය තුළ තිබුණු අග්ගලා දොස්තර නෝනාටත් සිරිල්ටත් පිළිගන්වන්නට විය.

තව ගොඩක් දුර යන්ඩ ඕනෑද බැලුන්ගලට යන්ඩ.

තව ටිකක් දුර තියනවා නෝනා

එලෙස පිළිතුරු දුන්නේ සිරිල්ය.

අග්ගලා කා නිමවූ පසු තිදෙනාම නැවත ගමන ආරම්භ කරන්නට විය. ටික වේලාවකට පසු තිදෙනාටම බැලුන් ගල මුදුනට ඒමට හැකිවිය.

හරිම ලස්සනයි. මුළු පැත්තම පේනවා නේද, සිරිල් අර පේන්නෙ අපේ ඉස්පිරිතාලෙ පැත්තට යන පාර නේද?

ඔව් නෝනා.

අර වැවත් පේනවා. එතකොට සිරිල් ඇයි මෙතනට බැලුන්ගල කියලා කියන්නෙ.

නෝනා මේ ප්‍රදේසෙ රජ කෙනෙක් ඉඳලා තියෙනවා. ඉතින් ඒ රජ්ජුරුවෝ යුධභටයො යොදවලා ඈතින් එන පිරිස් ගැන නිරීක්ෂණය කරලා තියෙන්නෙ මෙතන ඉඳලා. ඒකයි මෙතනට බැලුම් ගල කියලා කියන්නෙ. මේ බැලුන්ගලට සම්බන්ධ ඉතිහාස කතාව අපේ ලොකු ඉස්කෝලෙ මහත්තයා හොඳට දන්නවා.

මගේ මල්ලත් එහෙනං ලිහන්නම් නේද? ලොකු ඉස්කෝලෙ හාමිනේ අපි බැලුන්ගලට එනවා කීවට පස්සෙ මැගිලින්ට කියලා ලැවරිය හදලා දුන්නා.

දොස්තර නෝනා සිරිල්ටත්, මාලනීටත් ලැවරිය පිළිගන්වන්නට විය.

එතකොට නෝනා අර වගේ ප්‍රශ්න විසඳගන්න පුළුවන් වෙන ක්‍රම නැද්ද? එලෙස ඇසුවේ සිරිල්ය.

සිරිල් තව ක්‍රමයක් තියෙනවා බෞද්ධ දර්ශනයේ. ඒ තමයි, අදාළ දේවල්, අදාළ සිතිවිලි, අදාළ සිදුවීම් ගැන ත්‍රිලක්ෂණයට යොමු කරලා බලන එක. ඒ කියන්නෙ අපට අවශ්‍ය කාරණා දිහා අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දකින එක. ඒ පිළිබඳ මගේ දැනුම තාම අධ්‍යයන මට්ටමකයි තියෙන්නෙ. ඒක නිසා ඒ ගැන වැඩි විස්තර මම කියන්ඩ යන්නෙ නෑ. නමුත් දැනට අධ්‍යයනය කරපු දේවල් අනුව ත්‍රිලක්ෂණය තුළින් දැකීම ගොඩක් හොඳ දෙයක් කියලා මට හිතෙනවා. පුළුවන්නම් ඔයාලත් ඒ ගැන විස්තර හොයලා බලන්න. මොකද ඒ ගැන ගොඩක් විස්තර කියන්න මගේ දැනුම පෝසත් මදි.

අපි ඉස්සෙල්ලා කතා කරපු අභ්‍යන්තර යුද්ධ කථාවේදිත්, අභ්‍යන්තරව සිත තුළ ඇතිවෙන ආශ්‍රය කිරීම් තුළත් තියන්නෙ ප්‍රධාන වශයෙන් ඇලීම් සහ ගැටීම්. ඒ තුළින් තමයි ලෝකෙ බොහෝ ප්‍රශ්න නිර්මාණය වෙන්නෙ. ඇලීම් ඇති වෙන්නෙත් ආසාවල් නිසා. ගැටීම් ඇති වෙන්නෙත් ආසාවල් නිසා. එහෙම බලනකොට ප්‍රශ්නවලට මුල ආශාව. ඒ කියන්නෙ තෘෂ්ණාව. ඒකයි බුදු හාමුදුරුවෝ දේශනා කළේ තෘෂ්ණාව එහෙම නැත්නම් තණ්හාව නැති කිරීම නිවන කියන එක.

නෝනගෙ දැනට තියෙන ත්‍රිලක්ෂණය ගැන දැනුම අනුව අපි කොහොමද දෙයක් ගැන හරි, සිතිවිල්ලක් ගැන හරි ත්‍රිලක්ෂණයෙන් දැකලා ඒ දේ ගැන හරි ඒ සිතිවිල්ල ගැන හරි තියන ඇලීම්, ගැටීම් දුරුකරලා හිත නිවාගන්නෙ.

එලෙස දොස්තර නෝනාගෙන් ප්‍රශ්න ඇසුවේ සිරිල්ය.

සිරිල් අපි උදාහරණයක් හැටියට ප්‍රේමය ගැන ගම්මුකො. සිරිල් ප්‍රේමයේ අනිත්‍ය ස්වභාවයක් තියෙනවද නැද්ද?

අනිත්‍ය ස්වභාවයක් තියෙනවා නෝනා.

අනිත්‍ය ස්වභාවයෙන් ප්‍රේමය ගැන බලනකොට අපේ හිත ඇලීම්, ගැටීම් වලට යනවද සිරිල්.

නෑ නෝනා.

එතකොට සිරිල් ප්‍රේම කරනකොට රස්තියාදු වීම්, අනිත් කෙනා වෙනුවෙන් කැපකිරීම් කරන්න සිද්ධ වෙනවා. ඒක ප්‍රේමයේ දුක්ඛ ස්වභාවය. එතකොට සිරිල් ත්‍රිලක්ෂණයේ දුක්ඛ ස්වභාවය තුළින් ප්‍රේමය ගැන බලනකොට ප්‍රේමය ගැන ඇලීම් ගැලීම්, ඇති වෙනවද?

නෑ නෝනා.

ඊළඟට පැහැදිලි කරන්ඩ තියෙන්නෙ අනාත්ම ලක්ෂණය තුළින් ප්‍රේමය ගැන බැලීම. ඒකට ආත්ම ලක්ෂණය, අනාත්ම ලක්ෂණය කියන දෙකම පැහැදිලි කරන්න සිද්ධ වෙනවා.

මමය, මගේය යන හැඟීම, සියල්ල තමාගේ වසඟයේ පැවතිය යුතු බව නැත්නම් තමාගේ කැමැත්තේ හැටියට පැවතිය යුතු බව ආත්ම ලක්ෂණය වශයෙන් හඳුන්වන්න පුළුවන්.

මම කියා කෙනෙක් ගත නොහැකිවීම, මගේ කියා දෙයක් ගත නොහැකිවීම, සියල්ල තමාගේ වසඟයේ නොපවතින බව නැතිනම් තමාගේ කැමැත්තේ හැටියට නොපවතින බව අනාත්ම ලක්ෂණය වශයෙන් හඳුන්වන්න පුළුවන්.

අනාත්ම ලක්ෂණය ගැන තවදුරටත් පැහැදිලි කරනවා නම් අපේ ශරීරයට අපි සම්මුතියක් ඇතිකර ගෙන මම කියලා කියනවා. නමුත් පරමාර්ථ විදිහට ගත්තහම ඒ කියන්නෙ සත්‍ය වශයෙන්ම ගත්තහම නැතිනම් සොබාදහමෙ දෙයක් විදිහට ගත්තහම මම කියලා ගන්ඩ බෑ. එතකොට මම කියන්නෙත් සොබාදහමේ කොටසක්.

මේ ඇස් මගේ, මේ කන් මගේ, මේ දරුවන් මගේ, මේ වාහනය මගේ කියලා සම්මුතියක් ඇතිකර ගෙන තිබුනට ඒවත් පරමාර්ථ විදිහට ගත්තහම නැතිනම් සත්‍ය වශයෙන්ම ගත්තහම මට අයිති නැති සොබාදහමේ කොටස් විදිහටයි ගන්න වෙන්නෙ.

සියල්ල තමාගේ වසඟයේ පැවතිය යුතුය යනු තමාගේ කැමැත්තේ හැටියට පැවතිය යුතුය යන්නයි. නමුත් සියල්ල පවතින්නේ තමාට අවශ්‍ය විදිහට නොව සොබාදහමට අවශ්‍ය විදිහටයි. අපට අවශ්‍ය විදියට වෙනස් කළා කීවත් ඒවත් සිද්ධ වෙන්නෙ සොබාදහමේ නීතිවලට අනුවයි.

ඉතින් තමන් ප්‍රේම කරන කෙනා මාගේය යන හැඟීම අනාත්ම ලක්ෂණය තුළින් දැකීමෙන් නැතිවෙලා යනවා. ප්‍රේමය පැවැතිය යුත්තේ තමාගේ කැමැත්තේ හැටියටමයි කියන හැඟීමත් අනාත්ම ලක්ෂණය තුළින් දැකීමෙන් නැතිවෙලා යනවා.

ඉතින් ඔය විදිහට ප්‍රේමය ගැන අනාත්ම ලක්ෂණයෙන් දකින කෙනාට ප්‍රේමය ගැන ඇලීම්, ගැටීම් ඇති වෙනවද සිරිල්.

නෑ නෝනා.

එහෙමනම් සිරිල් ඇලීමෙන්, ගැටීමෙන් තොරව තියනකොට හිතේ තියෙන්නෙ නිවීමක්. ඒ නිසා ත්‍රිලක්ෂණයෙන් දකින බලන එක හිතේ තැන්පත් බවට හේතුවක්. අනිත් දේවල් ගැනත් ඔය විදිහටම තමයි බලන්න ඕන. මං තව උදාහරණයක් කියන්නම්.

අපි අපේ කෙස් ගත්තොත් කෙස් නිතර වැඩෙනවා. නොයෙකුත් වෙනස් වීම්වලට භාජනය වෙනවා. ඒ කෙස්වල අනිත්‍ය ලක්ෂණය.

හිසකෙස් පිරිසුදු කරන්න වෙනවා. පීරන්න වෙනවා. මේ වගේ කටයුතු හිසකෙස් වෙනුවෙන් කරන්න වෙනවා. ඒක මහා දුකක් ඒක හිසකෙස්වල දුක්ඛ ලක්ෂණය.

හිසකෙස් කොච්චර ලස්සනට තියාගෙන ඉන්න හැදුවත් කෙස් ඉදෙනවා, වැටෙනවා. ඒ කියන්නෙ අපේ වසඟයේ නොපවතින බව. නැතිනම් අපේ කැමැත්තේ හැටියට නොපවතින බව. ඒක හිසකෙස්වල අනාත්ම ලක්ෂණය.

එතකොට නෝනා මොකක්හරි උත්සාහ කිරීමක් දිහා ත්‍රිලක්ෂණයෙන් බලනකොට ඒ උත්සහ කිරීමට ත්‍රිලක්ෂණයෙන් බැලීම සෘණාත්මක බැලීමක් වෙන්නෙ නැද්ද?

කොහෙත්ම නෑ මාලනී. ත්‍රිලක්ෂණයෙන් දකිනවා කියන්නෙ තව පැත්තකින් ලෝකෙ ගැන යථා ස්වභාවයෙන් දැකීම. ලෝකෙ ගැන යථාස්වභාවයෙන් දකිනකොට ඒ කියන්නෙ ත්‍රිලක්ෂණයෙන් දකිනකොට අපි කරන උත්සහ කිරීමේදි මොන ගැටළු ආවත්, මේක ලෝකෙ තියන යථා ස්වභාවයක්, ඒක නිසා අපි ඒවට සැලෙන්ඩ හොඳ නෑ. වීරිය ඇතිකරගන්න ඕනෙ කියන හැඟීම එනවා. ඒ වගේම මේ දේවල්වලට ඇලීම්, ගැටීම් මනස පහත් මට්ටමකට වට්ටාගැනීම් අවශ්‍ය නැති බව වැටහෙනවා. ඒක නිසා ත්‍රිලක්ෂණය කියන්නෙ අපි කරන උත්සාහ කිරීම්වලට සෘණ ආකල්පයක් නෙවෙයි. අනික ලෝකෙ යථා ස්වභාවය අවබෝධයෙන් ඔළුවේ තියාගෙන වැඩ කරනකොට ඒක ඒ වැඩේට ලොකු හයියකුත් වෙනවා.

උදාහරණයක් විදිහට අපි තක්කාලි වගාකරන ගොවියෙක් ගම්මු. එයා මුලදි හිතනවා එයාගෙ තක්කාලි අස්වනු නෙලන කාලෙට තක්කාලිවලට ඉහළ මිලක් ලැබෙයි කියලා. නමුත් මිල බහිනවා. ඒ කියන්නෙ අපේ වසඟයේ, අපේ කැමැත්තේ හැටියට මිල නොපවතින බව. නැතිනම් අනාත්ම ලක්ෂණය. ඉතින් ඒ ගොවියා අනාත්ම ලක්ෂණය කටපාඩමින් නෙවෙයි. අවබෝධයෙන් යුතුව ඔළුවේ තියාගන කටයුතු කරන කෙනෙක්නම් ඒ දේට කාටවත් බනින්නෙ නෑ. දුක්වෙන්නෙ නෑ. එහෙම දෙයක් උනොත් කරන්න ඕනෙ මොනවද කියලා සැලසුම් හදාගෙන තියෙන්නත් පුළුවන්. එයා මිල අඩුවීම ගැන හිතේ ගැටීමක් ඇති කරගන්නෙ නෑ. ඒ ගැන දකින්නෙ බොහොම උපේක්ෂාවෙන්.

එතකොට නෝනා අනිත්‍ය ලක්ෂණයයි. අනාත්ම ලක්ෂණයයි දෙකම එක වගේ. මේ දෙක වෙනස් වෙන්නෙ කොහොමද?

මාලනී අනිත්‍ය කියන්නෙ වෙනස්වෙනවා කියන එකට. අනාත්ම ලක්ෂණයත් වෙනස් වීමක්ම තමයි. නමුත් ඒ වෙනස්වීම තමන්ගෙ කැමැත්තේ හැටියට පවත්වාගන යන්න බැරිවිදිහට වෙනස් වීමක් හැටියටයි ගන්නෙ.

එහෙමනම් සිරිල් අපි බහිමු නේද? ආව වගේම තවදුරක් යන්නත් එපායැ. අද රෑ වැඩත් තියනවා. මාලනීගෙ අග්ගලා ටිකනම් හරිම රසයි.

බොහොම ස්තූතියි නෝනා.

තිදෙනාම කන්ද බැස අවසන් වනවාත් සමගම දුටු පුද්ගලයෙකු නිසා මාලනී නොසන්සුන් වන්නට විය. එය දුටු දොස්තර නෝනා මාලනීගෙන් ඒ ගැන විමසන්නට විය.

මාලනී මොකද අරමනුස්සයා දැකලා තරහෙන් වගේ හිටියෙ.

නෝනා අපේ, පංසලේ බණ දවසේ තේ හැදුවෙ අපිනෙ. ඉතින් ඔය මිනිහා කියනවා තේ වල සීනි වැඩිලු. තේ එක කන්තලේ ගිහිල්ලලු. කිය කිය දොස් කියනවා. ඒ වෙලාවේ මට හිතුනා ඔය මිනිහගෙන් අහන්ඩ තමුසෙට දියවැඩියාවද කියලා. හොඳම වැඩේ නෝනා මේ මිනිහා බැන බැන තේ දෙකක්ම බීලා. රමණී අක්කා ඒක දැකලා තියනවා. මම එදා පංසලේ හින්දා ඉවසුවා. දැන් මං ඉවසන්නෙ නෝනා ඉන්න හින්දා. නැත්නං මගෙන් ඔය මිනිහා හොඳ දෙකක් අහගන්නවා.

එපා මාලනී, මාලනී පොඩ්ඩක්වත් ඉවසන්ඩ එපා.

දොස්තර නෝනා මාලනීට එසේ කියන විට සිරිල්ද, මාලනීද පුදුමයට පත්වී දොස්තර නෝනාගේ මුණ දෙස බලන්නට විය.

ඇයි නෝනා එහෙම කීවෙ. සිරිල් විමසන්නට විය.

සිරිල් මම මාලනීට එහෙම කීව එකෙන් අදහස් කළේ නෑ ඒ මනුස්සයාට ගහන්ඩවත්, බයින්ඩවත් කියලා. ඉවසනවා කියන එකේ අදහස හැඟීම දරාගන ඉන්නවා කියන එක. ඒක පීඩනයක් වෙන්න පුළුවන්. ඒක නිසා කරන්ඩ ඕනෙ ඉවසන එක නෙවෙයි. තරහ සමනය කරගන්න එක. ව්‍යාපාදය එහෙම නැත්නම් තරහ නොඉවසීම, අත් හැරීම, දුරු කිරීම, නැති කිරීම, අභාවයට පමුණුවාලීම, ප්‍රහාණ සංඥාවක් ලෙස ගිරිමානන්ද සූත්‍රයේදී බුදු හාමුදුරුවෝ දේශනා කරලා තියෙනවා. එතනත් ව්‍යාපාදය එහෙම නැත්නම් තරහ නොඉවසීම කියන්නෙ ගහගන්ඩවත්, බැනගන්ඩවත් කියන එක නෙවෙයි. තරහා වගේ දේවල් ඉවසන්න ගියොත් ඒවා පීඩනයක් බවට පත්වෙලා රෝග විදිහට හරි පිටවෙන්න පුළුවන්. ඒකයි මම කීවෙ. මාලනීට ඉවසන්ඩ එපා කියලා.

එතකොට නෝනා කොහොමද තරහ වගේ දෙයක් සමනය කරගන්නෙ.

ඒකට අපි මුලින් කථාකරපු දේවල් යොදාගන්නත් පුලුවන්. ඒවගේම මාලනී තරහ වගේ දේකදි අපි මුලින්ම හිතන්ඩ ඕනෙ අනිත් අයගේ ක්‍රියාකාරකම් මත අපේ වටිනාකම් නැති කර ගන්න ඕනැද කියන එක. තව සමහරු කවි ගීත ලියලා තමන්ගෙ හැඟීම් සමනය කර ගන්නවා. තවත් සමහරු නාට්‍යවගේ දේවල් නිර්මාණය කරනවා. කර්ම ශක්තිය විශ්වාස කරන කෙනෙක් නම් පෙර කර්මය නිසා සිදුඋනා කියලා හිත හදාගන්න පුළුවන්. භාවනා කිරීම් තුළිනුත් හිත සමනය කරගන්න පුලුවන්. එතකොට මනෝවිද්‍යාවෙදි ආපස්සට ගණන් කිරීම, ගැඹුරින් හුස්ම ගැනීම වාගෙ දේවලුත් මේකට යොදාගන්නවා.

දැන්නම් අපට සමුගන්න වෙලාවත් හරි. සිරිල්ටත්, මාලනීටත් ගොඩක් ස්තුතියි.

යං නෝනා මම ඉස්කෝලෙ මහත්තෙලාගෙ ගෙදර ළඟට ගිහින් ඇරලන්නම්.

"අපි යනවා සිරිල්" එලෙස පැවසුවේ දොස්තර නෝනා ය.

09 වැනි පරිච්ඡේදය

දිනක් දොස්තර නෝනා ඇගේ වීදුරු වතුර බෝතලයේ වතුර එළියේ තිබුණු මල්ගසකට හලන විට මාලනී පැමිණෙන්නට විය.

නෝනා ගමන් යනකොට වීදුරු වතුර බෝතලේ අරගෙනමයි යන්නෙ නේද?

ඔව් මාලනී. ඒක කරදරයක් කියලා පෙනුනට ඒක මම මගේ රට වෙනුවෙන් කරන කැපකිරීමක්, සේවයක් විදිහටයි මම දකින්නෙ.

ඒ මොකද නෝනා.

මං යන යන ගමනට වතුරබෝතල් සල්ලි දීලා අරගන, ඒ හිස් ප්ලාස්ටික් වතුර බෝතල් අපේ ගෙදර තියාගන්ඩ ගියොත්, එහෙම නැත්නම් මෙහෙ තිබ්බොත් මාස කීපයක් යනකොට හිස් බෝතල් ගොඩක් එකතු වෙනවා. මේවා ප්‍රතිචක්‍රීකරණය කරන්නෙත් නැත්නම්, මේවා පුච්චන කොට විෂ වායුත් නිකුත්

වෙනවා නම්, වලලන්න තමයි වෙන්නෙ. නමුත් වලලන එකත් සාර්ථක වැඩක් නෙවෙයි. මොකද අපේ පොළොවේ දෙයක් වගා කරන්න තියෙන ඉඩකඩ තමයි අපිට අහිමි වෙන්නෙ. ඉතින් මාලනී මම යන යන තැන වතුර බෝතලයක් අරගෙන යන එක ගැන දැන් මොකද හිතෙන්නෙ.

නෝනා හරි නෝනා.

අනිත් එක තමයි මාලනී අපේ රටට ගේන සෙල්ලම් බඩු වගේ දේවල් නිසාත් කුණුප්‍රශ්න ඇති වෙනවා. මුලින්ම සෙල්ලම් අවි ආයුධ ළමයින්ට දෙන එක නතර කරන්න ඕනෙ. අනිත් සෙල්ලම් බඩු ගෙන්නන්න එපා කියලා මම කියන්නෙ නෑ. නමුත් ඒ ගේන දේවල් උනත් දිරන ප්‍රතිචක්‍රීකරණය කරන්න පුළුවන් දේවල් නම් ගොඩක් හොඳයි. මාලනීලට මෙහෙ කුණු ප්‍රශ්නයක් නැතිඋනාට නගරවලට වෙන්ඩ කුණු කියන්නෙ මිනිස්සුන්ටත්, නගර සභාවලටත් විශාල ප්‍රශ්නයක්.

රටින් ගෙන්නන බඩුත් මෙහෙ නිපදවන බඩුත්, පුළුවන් දේවල් ප්‍රතිචක්‍රීකරණය කරන්න පුළුවන් විදියට හදනවා නම් ඒක ගොඩක් හොඳයි.

නෝනා මම කිරිටොපි හැදුවා. මෙන්න නෝනගෙ පාර්සලේ. මම අනිත් පාර්සලේ ඉස්කෝලෙ හාමිනේ අතට දීලා එන්නම්.

මාලනී මේක අපි රසවිඳින්ඩ අපේ කතා මණ්ඩපේ පැත්තට යමුද?

යමු නෝනා.

මාලනීගේ කිරි ටොපිවල රස බැලූ දොස්තර නෝනා

"ම්ම්ම්..... හරිම රසයි" කියමින් කිරිටොපිවල රස මාලනීට ප්‍රකාශකරන්නට විය.

ඒක නෙමෙයි මාලනී ලොකු ඉස්කෝලෙ මහත්තයා හරියට ආදර්ශමත් පොත් තියෙන ලොකු පුස්තකාලයක් වගේ කියලා මට හිතෙනවා. දොස්තර නෝනා එලෙස කීවේ තවත් කිරිටොපි කෑල්ලක රස බලමිනි.

ඇයි නෝනා එහෙම කීවෙ.

මාලනී මට ලොකු ඉස්කෝලෙ මහත්තයා කීව කථා දෙක තුනක් මතක් උනා. ඒකයි මං එහෙම කීවෙ.

අනේ නෝනා කියන්ඩකෝ. මමත් ආසයි කථා අහන්ඩ.

ඕං එහෙනං අහගන්ඩ

පිටරටක අශ්වයෝ ඇතිකරන මනුස්සයෙක්ගෙ වෙළඹක් තණකොළ කන්ඩ ඇරලා හිටියා. නමුත් වෙළඹ ආපහු ආවේ නෑ. මේ අයිතිකාර මනුස්සයා වෙළඹ හොයන්ඩ ගොඩාක් උත්සාහ ගත්තා. නමුත් හම්බුනේ නෑ. ගමේ මිනිස්සුත් ඒකට උදව් කළා. ඒ හම්බුනෙත් නෑ. අන්තිමේ දි ඒ උදව් කරන්න ආව මිනිස්සු වෙළඹ අයිතිකාර මනුස්සයාට කීවා අනේ හරිම අවාසනාවන්ත සිදුවීමක් නේද උනේ කියලා. වෙළඹ අයිතිකාර මනුස්සයා එතකොට කියනවා වාසනාවද, අවාසනාවද කියන්න දන්නෙ නෑ කියලා.

ඔහොම ටික දවසක් යනකොට අර ගියපු වෙළඹ තව ජවසම්පන්න කැළෑ අශ්වයෝ දෙන්නෙකුත් එක්ක ආපහු වෙළඹ අයිතිකාර මනුස්සයා ළඟටම ආවා. ඊට පස්සෙ ගමේ මිනිස්සු අශ්වයෝ අයිතිකාර මනුස්සයාගෙන් අහනවා හරිම වාසනාවන්ත සිදුවීමක් නේද උනේ කියලා. එතකොටත් කියනවා වාසනාවද අවාසනාවද කියන්න දන්නෙ නෑ කියලා.

අලුතෙන් ආව අශ්වයෝ පුහුණු කරන්න ගිහිල්ලා අශ්වයෝ අයිතිකාර මනුස්සයගෙ තරුණ පුතාගේ කකුලක් කැඩෙනවා. ඒකටත් ගමේ මිනිස්සු ඇවිල්ලා ගොඩක් උදව් කරනවා. බලන්ඩ තෑගි බෝගත් අරගෙන එනවා. බලන්න එන සමහර අය හරිම අවාසනාවන්ත සිදුවීමක් නේද උනේ කියලා අශ්වයෝ අයිතිකාර මනුස්සයාට කියනවා. එතැනදිත් අශ්වයෝ අයිතිකාර මනුස්සයා කියනවා වාසනාවද අවාසනාවද කියන්න දන්නෙ නෑ කියලා.

මෙහෙම ටික දවසක් යනකොට යුද්ධයක් ඇවිල්ලා රටේ තරුණයෝ බලෙන්ම යුද්ධයට බඳවා ගන්නවා. නමුත් මේ තරුණයාගෙ කකුල කැඩිලා නිසා යුද්ධයට බඳවා ගත්තෙ නෑ.

බලන්ඩ මාලනී එක එක දේවල් දිහා එක් එක් කෙනා බලන තාලෙ. අපි දෙයක් දිහා බලන විදිහ අනුව ඒක අපිට දුක සතුට ඇතිවෙන්ඩ බලපානවා. මම ඒවගේ තව කතාවක් කියන්නම්.

හා...

කාශ්‍යප බුදුහාමුදුරුවෝ වැඩ හිටපු කාලේ සුමංගල කියලා සිටුවරයෙක් හිටියා. එතුමා බුදුහාමුදුරුවන්ට සුගන්ධ කුටියක් සහිත විහාරයක් කරවලා පූජා කරලා තියෙනවා. ඒ විහාරෙට නිතර නිතර යනකොට දවසක් පාර අයිනෙ තියන අම්බලමක මහදවාලෙ මනුස්සයෙක් නිදාගෙන ඉන්නවා දැකලා රෑ ඇවිදින දවල් නිදන මනුස්සයෙක් කියලා සිටුතුමාට නිකමට වගේ කියවෙලා තියෙනවා. ඒක ඇහිච්ච අර මනුස්සයා ගොඩක් තරහ අරගෙන ඇස් ඇරලා බලනකොට සිටුතුමා. ඒ නිසා එහෙමම නිදාගත්තා වගේ හිටියා. නමුත් හිතේ තරහ එහෙමමයි.

ඊට පස්සෙ මේ මනුස්සයා හිතනවා හොඳ වැඩක් කරන්න ඕනෙ කියලා. ඒ හිතලා සිටුතුමාගෙ කුඹුරුවලට හත්සැරයක් ගිනි තියනවා. හත් සැරයක් සිටුතුමාගෙ ගව පට්ටිටයේ ගවයින්ගෙ කකුල් කපනවා. හත් සැරයක් සිටුතුමාගෙ නිවාස ගිනි තියනවා. ඒ දේවල් කරලා සිටුතුමාට තරහ ගියාද, දුක් උනාද බලන්ඩ වෙස්වෙලාගෙන ගිහිල්ලා සිටුතුමාගෙ සේවකයෙකුගෙන් මෙහෙම අහනවා. සිටුතුමාට මේ දවස් වල කරදරයිලු නේද කියලා. සේවකයා කියනවා ඒ සිද්දවෙච්ච දේවල් ගැන සිටුතුමාට ගානක්වත් නෑ. සිටුතුමා ඒ දේවල් ගැන නෙවෙයි හිතන්නෙ. සිටුතුමාගෙ හිත තියෙන්නෙ නිතර විහාරෙට යන එන එක ගැන තමා කියලා කියනවා. එතකොට මේ මනුස්සයා හිතනවා සිටුතුමා තරහ ගස්සන්න විහාරෙට ගිනි තියන්න ඕනෙ කියලා. ඒ හිතලා සුගන්ධ කුටියට ගිනි තියනවා.

මාලනී හිතන්නෙ සිටුතුමාට ඒ වෙලාවේ මොන වගේ සිතිවිල්ලක් ඇතිවෙන්න ඇති කියලද?

සිටුතුමාට හොඳටම තරහයන්න ඇති.

ඒ උනාට සිටුතුමාට නම් පොඩ්ඩක්වත් තරහ ගියේ නෑ. සිටුතුමා ඒ ගැන මෙහෙම හිතනවා. තිබුනටත් වඩා හොඳට මට සුගන්ධ කුටියක් හදලා පූජාකරලා පින් රැස් කරගන්ඩ අවස්ථාවක් ලැබුණා කියලා හිතලා සිටුතුමා අත්පොලසන් නාද පවත්වනවා.

ඊට පස්සෙ සුගන්ධ කුටිය හදලා පූජාකරන වෙලාවෙ සිටුතුමා කියනවා සුගන්ධ කුටියට ගිනි තිබ්බ පුද්ගලයා කවුද කියන්න මම දන්නෙ නෑ. මම ඒ පුද්ගලයට වෛර කරන්නෙත් නෑ. මට දෙවැනි වතාවටත් සුගන්ධ කුටියක් හදලා පූජා කරලා පින් රැස්කරගන්ඩ ලැබුනෙ ඒ පුද්ගලයා නිසා. ඒ නිසා මම ඒ පුද්ගලයට අනුකම්පා කරනවා. මෛත්‍රී කරනවා කියලා ප්‍රකාශ කරනවා. ඒක හැංගිලා අහගෙන හිටපු අර මනුස්සයා කම්පාවට පත්වෙලා සිටුතුමාගෙන් සමාව අරගෙන සුගන්ධ කුටිය විනාශ කරන්න හේතුව සිටුතුමාට පහදලා දෙනවා.

බලන්ඩ මාලනී එතනදි වෙන කෙනෙක් වෙන විදිහකට හිතලා තරහ ඇති කරගන්ඩ පුලුවන්. නමුත් සිටුතුමා හිතපු ආකාරය වෙනස් ඒ නිසා සිටුතුමාට තරහ ගියේ නෑ.

අනේ නෝනා ඒ වගේ තව කතාවක් කියන්ඩකෝ.

මාලනී දන්නවද බල්බ් එක හොයාගත්තෙ කවුද කියලා.

ඔව් නෝනා, තොමස් අල්වා එඩිසන් මහත්තයා.

අන්න හරි, තෝමස් අල්වා එඩිසන් බල්බ් එක හොයාගන්න උත්සහ ගන්නකොට දාස් වතාවට වැඩිය වැරදුනා කියලා කියනවා. නමුත් උත්සාහය අත්හැරියෙ නෑ.

තෝමස් අල්වා එඩිසන් බල්බ් එක හොයාගන්ඩ ඉස්සෙල්ලා වැරදුන අවස්ථාවකදි පුද්ගලයෙක් ඒක දැකලා කියලා තියෙනවා ආයෙත් වැරදුනා නේද කියලා. එතකොට තෝමස් අල්වා එඩිසන් කියලා තියෙනවා බල්බ් එක හදනකොට වරදින්න තියෙන තව හේතුවක් මම හොයාගත්තා කියලා.

ඉතින් බලන්න මාලනී තෝමස් අල්වා එඩිසන් ඒ සිදුවීම ගැන බලපු ආකාරය. තවකෙනෙක් ඔය සිදුවීම ගැන වෙනත් විදියකට බලන්න පුළුවන්. අර තෝමස් අල්වා එඩිසන්ගෙන් ආයෙත් වැරදුනා නේද කියලා අහපු පුද්ගලයා වගේ.

එතකොට මාලනී හේතුවක් නිසා ඵලයක් හටගන්නවා. එහෙමයි බෞද්ධ ඉගැන්වීම්වල තියෙන්නෙ.

මාලනී ප්‍රශ්න එනකොට මේ ප්‍රශ්නෙ මටම ආපු එකක් මේ ප්‍රශ්නෙ අපිටම ආපු එකක් කියලා ප්‍රශ්නෙ මටම කරගන ප්‍රශ්නෙ අපිටම කරගන හිතුවොත්ද ලේසි, මේ ප්‍රශ්නෙ මට විතරක් නෙවෙයි අපිට විතරක් නෙවෙයි ලෝකෙ අනික් අයටත් තියෙන්න පුළුවන්, අතීතයේ තිබුනා වෙන්නත් පුළුවන්, වර්තමානයේ තියනවා වෙන්නත් පුළුවන්, අනාගතේ ඇති වෙන්නත් පුළුවන්. මේක හේතුවක් නිසා ඵලයක් හට ගත් අවස්ථාවක්, මේක සොබාධර්මයේ පවතින ස්වභාවයක් කියලා හිතන, කාරණා දෙකෙන් කෝකද මාලනී හිතට පහසු හිතට බර දැනෙනවා අඩු.

දෙවැනි ක්‍රමය පහසුයි නෝනා.

ආ..... ඕකට තමයි ඔය මමත්වයෙන් තොරව හිතනවා කියන්නෙ. ඒ කියන්නෙ ප්‍රශ්නෙ මගේම කරගන, ප්‍රශ්නෙ අපේම කරගන නොසිතන එකට. එතකොට හිතට බර දැනෙනවා අඩුයි.

ඕකට හොඳ උදාහරණ කතාවක් බෞද්ධ සාහිත්‍යයේ තියනවා. ඒ තමයි කිසාගෝතමීගේ කථාව.

ඒක නෙවෙයි මාලනී ඔය වගේ හිතට ධෛර්ය ඇතිවෙන කථා එකතු කරලා, ඒවා ලියපු පොත් කීපයක්ම ලොකු ඉස්කෝලෙ මහත්තයා ළඟ තියෙනවා. මටත් දුන්නා බලන්ඩ. මාත් එකක් දෙකක් බැලුවා. ඒවා බලපුවාම හිතට පුදුම හයියක් එනවා. ඔන්න මාලනී කෙනෙකුට කරන්ඩ පුළුවන් නම්

හොඳ විනෝදාංශයක්. මේ වගේ කතා එකතු කරන එක. පස්සෙ පොතක් උනත් අච්චු ගහන්න පුලුවන්නෙ. ඒ වගේ දෙයක් කවුරුහරි කරනවා නම් ඒක රටටම කරන ලොකු සේවයක්.

ඒක තමා නෝනා අපි ඉස්කෝලෙ යන කාලේ ලොකු ඉස්කෝලෙ මහත්තයා හැමදාම සඳුදා රැස්වීමේදි ඔයවගේ කථාවක් කියනවාමයි.

10 වැනි පරිච්ඡේදය

දොස්තර නෝනා දිනක් පේරාදෙණිය ගැටඹේ බෝධිය වැඳ පුදා අවසන් වනවාත් සමගම ඇගේ පිටුපසින් සුපුරුදු හඬකින් "සෞම්‍යා" කියා අමතනු ඇසිනි.

ආ..... ප්‍රසාදි

ඔයා කොහෙද මෙහෙ

මම වැඩකට පේරාදෙණිය හොස්පිටල් එකට ආවා.

අපි දුර ඉදලා හම්බුනාට මෙහෙම හම්බෙනවා අඩුයිනෙ. ඔයාට වෙලාවක් තියෙනවනම් අපි මල්වත්ත පැත්තට ගිහිල්ලා ටිකක් කථාකරමු.

හා හොඳයි එහෙනම් අපි යමු ප්‍රසාදි

සිල්ලර පහේ කෑම ටිකකුත් මිලදීගත් මිතුරියන් දෙදෙනා පේරාදෙණිය උද්භිත උද්‍යානයට ඇතුල්වන්නට විය. ඉන්පසු මිතුරියන් දෙදෙනා සුදුසු තැනක් බලා වාඩිවෙන්නට විය.

ඉතින් ඉතින් ප්‍රසාදි කොහොමද අලුත්ම තොරතුරු.

මම නම් හොඳින් ඉන්නවා.

ඔයාට කොහොමද සෞම්‍යා

මමත් ඉතාම හොඳින් ඉන්නවා

එතකොට..... විදුර එහෙම කොහොමද?

අම්මේ..... විදුර ගැන ඇහුවා විතරයි. කෙල්ලගෙ මූණෙ පෙම් පෙරෙනවා.

විදුර, විදුර රණබාහු, විදුර රණබාහු දොස්තර නෝනාට මුණගැසුණේ පේරාදෙණිය වෛද්‍ය පීඨය තුළිනි. ඔහුත් දොස්තර නෝනාත් එකම වසරේ වෛද්‍ය සිසුන් වූ අතර විදුර රණබාහුද දැනට වෛද්‍යවරයෙකු වශයෙන් සේවය කරයි.

විදුර මේ දවස්වල ස්කෑන් මැෂින් එකක් ගැන පරීක්ෂණ කරනවා.

රිසච් ගැන අහන්ඩනම් මමත් ආසයි.

ඉතිං එහෙනං මං කියන්නං.

මේක පොඩි ස්කෑන් මැෂින් එකක්. අත්දෙකේ ඇඟිලි දහය ස්කෑන් මැෂින් එකට දාලා දත්ත දුන්නට පස්සෙ ගැටළු තියන ඉන්ද්‍රියන් ගැනත්, අපේ ඇඟවලට තියෙන ඕරාවකේ තත්වය ගැනත්, චක්‍රවල පිහිටීම් ගැනත්, ආතති තත්ව ගැනත් වගේ ගොඩක් තොරතුරු දැනගන්න පුළුවන්.

මේක හදලා තියෙන්නෙ රුසියාවේ Korotkov reveals කියන මහාචාර්යතුමා. *(Dr. Korotkov reveals the revolutionary Bio-Well technology) https://www.youtube.com/watch?v=PZHxW25UVWo and, https://www.bio-well.com/*

ඉහත සඳහන් බයෝ-වෙල් කියන වෙබ් අඩවියට හෝ යූටියුබ් වෙත ගිහිල්ලා මේ ගැන තොරතුරු දැනගන්න පුළුවන්.

දොඩම්ගොඩ රංජිත් ඕපාත මහත්තයාගෙ මේ ජාතියෙ මැෂින් එකක් තියනවා. ඒක දවසක් කුරුණෑගලට ගෙනාපුවෙලාවෙ තමයි විදුර මුලින්ම මේ මැෂින් එකෙන් බලවලා තියෙන්නෙ. විදුර මුලින්ම සාමාන්‍ය විදියට ස්කෑන් කරලා තොරතුරු අරගෙන තියෙනවා. ඊට විනාඩි ගාණකට පස්සෙ දියමන්තියක් අතේ තියාගන ටිකක් වෙලා ඉඳලා ස්කෑන් කරලා තොරතුරු අරගන තියෙනවා.

මුලදි තිබුණ චක්‍රවල බැලන්ස් එකට වැඩිය දියමන්තිය අතට ගත්තට පස්සෙ චක්‍රවල බැලන්ස් එක වැඩිඋනා කියලා විදුර කීවා. ඒ වගේම මුලින් ලෙඩ ඇතිවීමට අවදානම් තිබිච්ච ඉන්ද්‍රියන් දියමන්තිය අතට ගත්තට පස්සෙ වෙනස් උනා කියලත් කීවා.

ඉතින් සෞම්‍යා ඔයා ගියේ නැද්ද බලන්ඩ

විදුරත් එක්ක දවසක් මමත් ගියා දොඩම්ගොඩ රංජිත් ඕපාත මහත්තයාගෙ කාර්යාලෙට. එදා විදුර මුලින්ම නිකං ස්කෑන් එකක් අරගත්තා. එකේ විදුරගෙ අක්මාවෙ ප්‍රශ්නයක් තියෙනවා කියලා පෙන්නුවා. ඊට ටික වෙලාවකට පස්සෙ ඉඟිනි ඇට කුඩුයි, කුඹුක් පොතු කුඩුයි එකට එකතු කරලා විදුර පරීක්ෂණ කරන්ඩ හදපු බෙත විදුර අල්ලගෙන ස්කෑන් එකක් අරගෙන බැලුවා. ඒ බෙහෙතට අක්මාවෙ ප්‍රශ්නෙ පෙන්නලා තිබුනෙ නෑ. චක්‍ර පද්ධතියත් මුලින්ට වඩා බැලන්ස් වෙලා තිබුණා.

ඉතින් විදුර කියනවා මුලින්ම කරපු දවසෙ දියමන්තිය අල්ලාගත්තට පස්සෙ තිබුණු රෝග සුවවෙලා පෙන්නපු නිසයි. ඉඟිනි ඇට කුඩුයි, කුඹුක් පොතු කුඩුයි බෙත අල්ල ගත්තට පස්සෙ අක්මාවෙ ප්‍රශ්න නැතිඋනා කියලා පෙන්නපු නිසයි. මේ ස්කෑන් යන්ත්‍රය මගින් බෙත් සොයාගැනීම් කරන්ඩ පුළුවන් වෙයි කියලා. එහෙම උනොත් පිළිකා වගේ ලෙඩකට උනත් බෙතක් අතට දීලා ඒක පිළිකා හොඳ වෙන්න බලපාන බෙතක්ද නැද්ද කියලා බලාගන්ඩ පුළුවන් වෙයි කියලා විදුර කීවා.

මුදලින් අඩු මැණික් කීවත් ශරීරයට ශුභදායක බලපෑමක් ගේන මැණික් ගල් ජාති ගොඩක් අපේ රටේ තියනවා. ඒවා හොයාගන ඒ වගේ දේවල් ප්‍රයෝජනයට ගන්ඩ, විදේශිකයන්ට දෙන්ඩ ක්‍රමයක් හැදුවොත් ඒක අපේ රටට හොඳ ආදායම් මාර්ගයක් වෙයි කියලත් විදුර කීවා.

ප්‍රසාදි ඊළඟ විදුරගෙ පරීක්ෂණේ නම් මට ඉතාම වැදගත් උනා.

ඒ මොකද බං

විදුරගෙ ඊළඟ පරීක්ෂණය සැලසුම් කරලා තිබුනෙ කෙනෙකුගෙ ශරීර ස්පර්ශයක් තවත් කෙනෙකුගෙ ශරීරයට බලපාන්නෙ කොහොමද කියලා හොයලා බලන්ඩ.

ඒකෙදි මුලින්ම විදුර සාමාන්‍ය විදිහට ස්කෑන් කලා. ඊළඟට මගෙ අත අල්ලගෙන විනාඩි දහයක් විතර ඉඳලා අත අල්ලගෙනම ස්කෑන් කළා. ඒකෙදි මුලින් ගත්ත ස්කෑන් එකට වඩා විදුරගෙ චක්‍ර බැලන්ස් වෙලා තිබුණා. ඕරාවත් වැඩි වෙලා තිබුණා. ඒක බලලා විදුර මට කීවා මගෙ පොරොන්දම් පරීක්ෂණයෙන් ඔයා සමත් කියලා.

ඉතිං විදුර කියනවා මේ මැෂින් එක ගැන තොරතුරු එයාට තවත් හොයලා බලන්ඩ ඕනෙ කියලා.

11 වැනි පරිච්ඡේදය

දොස්තර නෝනාත් මාලනීත් දිනක් මාලනීගේ නිවස කරා පියනගන්නට විය. ඒ යන අතරතුරදී මාලනී ගේ නිවස අසල දී මෝට සයිකලයෙන් යන සිරිල් ද මුණගැසිණි. සිරිල්ගේ මෝටසයිකලේ මල්ලක් තිබෙනු දුටු මාලනී ඒ ගැන විමසන්නට විය.

මොනවද ඔය මල්ලෙ

මේකෙ තියෙන්නෙ පැණිදොඩම්. ඔයාලටත් ගෙඩි ටිකක් දීලා යන්ඩ පුළුවන්. දොස්තර නෝනටත් හදලා දෙන්න පුලුවන්නෙ.

එහෙනං අපේ ගේ ළඟට ආපු එකේ සිරිලුත් පැණිදොඩම් වීදුරුවක් බීලා යමු.

එයට කැමති වූ සිරිල් තමන් ළඟ තිබුණු පැණිදොඩම් ගෙඩිවලින් පහක් පමණ මාලනී අතට දෙන්නට විය.

මාලනීගේ නිවසේ අඹ ගසක් යට තනා තිබුණු ලෑලි බංකුවක දොස්තර නෝනා අසුන්ගත් අතර එහි වාඩි වීමට දොස්තර නෝනගෙන් සිරිල්ටද ඇරයුම්

ලැබුණි. නමුත් දොස්තර නෝනාට තිබෙන ගෞරවය නිසාම සිරිල් ඒ අසල තිබුණු පැතලි කළුගල් කෑල්ලක් මත වාඩිවෙන්නට විය.

ටික වේලාවක් යනවිට මාලනී දොස්තර නෝනාටත් සිරිල්ටත් බන්දේසියක තබා පැණිදොඩම් වීදුරු දෙකක් රැගෙන එන්නට විය.

"ඇයි මාලනී බොන්නෙ නැද්ද" දොස්තර නෝනා අසන්නට විය.

මං පස්සෙ බොන්නම් නෝනා

පැණිදොඩම් සිලින්ඩරාකාර වීදුරුවලට දමා තිබූ අතර දොස්තර නෝනා තමන්ගේ පැණි දොඩම් වීදුරුවෙන් අඩක් බී ඉතුරු භාගය පානය කිරීමට පෙර එය මඳක් උඩට ඔසවා සිරිල්ටත් මාලනීටත් කුමක් කීමට හැකි දැයි ප්‍රශ්න කළාය.

වීදුරුවේ අඩක් පිරී ඇති බව සිරිල් ප්‍රකාශ කරයි. වීදුරුවේ අඩක් හිස් බව මාලනී ප්‍රකාශ කරයි.

ඉන්පසු සිරිලුත් මාලනීත් දෙදෙනාගෙන් කවුද හරිකියා දැනගැනීමට දෙදෙනාම දෑස් දල්වා ගනිමින් දොස්තර නෝනාගෙන් පිළිතුරු ලැබෙනතුරු බලාසිටි. දෙදෙනාම හරි බව දොස්තර නෝනා ප්‍රකාශ කරයි. නමුත් වඩා වැදගත් වන්නේ අවස්ථානුකූලව හිතට සැහැල්ලුව. සතුට ගෙනදෙන පිළිතුර බව දොස්තර නෝනා පහදා දෙයි.

ඕකට මං උදාහරණ කිහිපයකුත් දෙන්නම්, උදාහරණයක් විදිහට ගංවතුරක් ආව අවස්ථාවකදී අපිට ගංවතුර ආවත් අරගොල්ලන්ට තරම් ගංවතුර අපට ආවෙ නෑ කියලා සතුටු වෙන්න පුළුවන්.

නියගයකදී නම් අරගොල්ලන්ට තරම් තදින් අපට නියගය බලපෑවෙ නෑ කියලා සතුටු වෙන්න පුළුවන්.

මට ඕකට තව බෞද්ධ සාහිත්‍යයේ එන හොඳ කතාවකුත් මතක් උනා.

අනේ නෝනා කියන්ඩකෝ. එලෙස ප්‍රකාශකළේ මාලනීය.

බුදුහාමුදුරුවෝ වැඩ හිටපු කාලෙ පුණ්ණ කියලා හාමුදුරුනමක් වැඩ හිටියා. උන්වහන්සෙ බුදුහාමුදුරුවන්ගෙන් ධර්මය ඉගනගෙන කමටහන්

අරගෙන සුනාපරන්ත දේශය කියන ප්‍රදේශයට වැඩම කරලා භාවනා කරන්න බුදු හාමුදුරුවන්ගෙන් අවසර ඉල්ලා සිටියා. ඒ අවස්ථාවේ දී බුදුහාමුදුරුවෝ පුණ්ණ හාමුදුරුවන්ගෙන් විමසා සිටියා. පුණ්ණ සුනාපරන්ත දේශයේ මහ දරුණු මිනිස්සු ඉන්නෙ ඔවුන් ඔබට බැන්නොත් ඔබ මොකද කරන්නෙ කියලා. එවිට පුණ්ණ හාමුදුරුවෝ බුදුහාමුදුරුවන්ට ප්‍රකාශ කරනවා ඔවුන් මට ගැහුවෙ නැති නිසා තරහ නොගෙන ඔවුන්ට මෛත්‍රී කරන බව. ඉන්පසු බුදුහාමුදුරුවෝ විමසා සිටිනවා ඔවුන් ඔබට ගැහුවොත් ඔබ මොකද කරන්නෙ කියලා. එවිට පුණ්ණ හාමුදුරුවෝ ප්‍රකාශ කරනවා ඔවුන් මට දඬු මුගුරුවලින් පහර දුන්නේ නැනෙ කියලා ඔවුන්ට මෛත්‍රී කරන බව. ඉන්පසු බුදුහාමුදුරුවෝ විමසා සිටිනවා ඔවුන් ඔබට දඬුමුගුරුවලින් පහර දුන්නොත් ඔබ මොකද කරන්නෙ කියලා. එවිට පුණ්ණ හාමුදුරුවෝ ප්‍රකාශ කරනවා ඔවුන් මට අවිආයුධවලින් පහර දුන්නෙ නැනෙ කියලා ඔවුන්ට මෛත්‍රී කරන බව. ඉන්පසු බුදුහාමුදුරුවෝ විමසා සිටිනවා ඔවුන් ඔබට අවිආයුධවලින් පහර දුන්නොත් ඔබ මොකද කරන්නෙ කියලා. එවිට පුණ්ණ හාමුදුරුවෝ ප්‍රකාශ කරනවා ඔවුන් මාව මරන්න හැදුවෙ නැනෙ කියලා ඔවුන්ට මෛත්‍රී කරන බව. ඉන්පසුව බුදුහාමුදුරුවෝ විමසා සිටිනවා ඔවුන් ඔබව මරන්න හැදුවොත් ඔබ මොකද කරන්නෙ කියලා. එවිට පුණ්ණ හාමුදුරුවෝ ප්‍රකාශ කරනවා බුදුහාමුදුරුවනේ මිනිස්සු බොහොම දුක් විඳලත් මැරෙනවා. කවදහරි මැරෙනවා. කවදා හෝ සිදුවන මරණය ඔවුන් නිසා මට පහසුවෙන් සිදුවෙනවා. ඒ නිසා මම ඔවුන්ට මෛත්‍රී කරනවා කියලා බුදුහාමුදුරුවන්ට ප්‍රකාශ කරනවා.

ඒ ප්‍රකාශනවලට සවන්දීගෙන හිටපු බුදුහාමුදුරුවෝ සුනාපරන්ත දේශයට යෑමට සුදුසු හිමිනමක් බව ප්‍රකාශ කරලා ඒ සඳහා පුණ්ණහිමියන්ට අවසර ලබාදෙනවා.

අපි ජීවිතේ ගෙනියන කොට එක් එක් පුද්ගලයින්ගෙන් මනාපවීම්, අමනාපවීම්, ආදරය ලැබීම්, දොස් ලැබීම්, උදව් ලැබීම්, පාඩු ලැබීම්, ප්‍රියවචන, සැරවචන වගේ දේවල් නිතර නිතර ලැබෙන්න පුළුවන්.

එක පුද්ගලයෙක් විතරක් අරගෙන එයාගෙන් අපට ලැබුණු කටුක අද්දැකීම් ගැන පමණක් හිතුවොත් අපිට තරහ එන්න පුළුවන්. ඒ නිසා අපේ හිතේ තියන සතුට නැතිවෙන්න පුළුවන්.

ඒ පුද්ගලයා නිසා අපි ලබපු මිහිරි අත්දැකීම් ගැන බැලීමෙන් අපේ හිතේ වෛර සිතුවිලි තිබුණානම් ඒවා නැතිකරගන අපේ හිතේ සතුටුදායක සිතුවිලි ඇතිකරගන්න පුළුවන්. ඉතින් අපි දෙයක් දිහා බලන්න ඕනෙ හිතට සැහැල්ලුව, සතුට, සැනසුම ඇතිවෙන විදිහට.

නෝනා, කසාද බැඳපු අයට නම් මේ ක්‍රමේ ගොඩක් හොඳයි නේද? එලෙස ඇසුවේ සිරිල් ය.

ඔව් සිරිල් විවාහ සහකරුගේ හෝ සහකාරියගේ තියෙන හොඳ ගැන හිතලා සතුටු වෙනවා වගේම අනික් අයට සාපේක්ෂව මගේ සහකරු හෝ සහකාරිය ළඟ මෙවැනි දුර්ගුණ, දුර්වලතා නැති බව දැකීමෙනුත් හිතේ සතුට සැහැල්ලුව රඳවගන්න පුළුවන්.

12 වැනි පරිච්ඡේදය

මාලනී මල්ලක් ද රැගෙන ගුරු ගෙදරට පිවිසෙයි'

මාලනී මල්ලක් එහෙම අරගෙන කොහෙද මේ.....

එසේ ඇසුවේ ලොකු ඉස්කෝලෙ හාමිනේය.

මම තුනේ කණුවෙ විල්සන් මහත්තෙයාලගෙ ගෙදර ගියා.

විල්සන් මහත්තයාගෙ දෙවැනි දුවට අසනීප උනා කියලා කීවා. දැං කොහොමද?

තාම නම් හරියට අඩු උනේ නෑ කියලා තමයි කියන්නෙ.

කලු උනාට සීදේවි කෙල්ල. එලෙස කීවේ ලොකු ඉස්කෝලෙ හාමිනේය.

දොස්තර නෝනා ද සිටියේ මාලනීගේත් ඉස්කෝලෙ හාමිනේගෙත් සංවාදය ඇසෙන දුරය.

මාලනී ළඟ තිබුණ මල්ලෙන් පාර්සල් දෙකක් එළියට ගෙන එකක් ඉස්කෝලෙ හාමිනේටත්, අනික දොස්තර නෝනාටත් දෙන්නට විය.

මොනවද මාලනී මේ, එලෙස ඇසුවේ ඉස්කෝලෙ හාමිනේය.

මම හදපු වඩේ ටිකකුයි, පැටිස් ටිකකුයි

මාලනී කොහොමත් කෑම හදන්ඩ දක්ෂයානෙ. එහෙමනං මාලනී අපේ නෝනත් එක්ක කථා කර කර ඉන්ඩ. මම ගිහිල්ලා තේ ටිකක් හදාගන එන්නම්.

දොස්තර නෝනාත් මාලනීත් සුපුරුදු කතා මණ්ඩපයට පිවිසෙයි.

කවුද මාලනී ලෙඩෙක් බලන්ඩ ගියා කීවෙ.

ඒ මගේ ඉස්කෝලෙ යන කාලේ හිටිය හොදම යාළුවෙක්. එයාට කොන්දෙ අමාරුවක් හැදිලා ඒක නිතර නිතර අල්ලනවා. ස්කෑන් කරලත් බලලා. තවත් පරීක්ෂණ කරලා බලලා. ඒ හැම එකකම කිසි ප්‍රශ්නයක් නෑ කියලා තමයි කියන්නෙ. අන්තිමේට දෙහිත් කපලා. ගොඩක් තැන්වලට සාත්තර බලන්ඩත් ගිහිල්ලා ඒ තැන්වලිනුත් කියවෙලා තියන්නෙ ඇඟ ඇතුළෙ ප්‍රශ්නයක් නෑ කියලලු. ඒ උනාට තාම සුවයක් නෑ කියලා තමයි කියන්නෙ.

මාලනී ඔය ගෑනු ළමයගෙ තදබල ප්‍රේම සම්බන්දයක් තිබ්බද?

අප්පේ නෝනා සාත්තර කියන්ඩත් දන්නවනෙ "තිබ්බා" "තිබ්බා"

එතකොට ඒ සම්බන්ධෙට ගොඩක් බාධක ආවා.

නෝනා බලාගෙන හිටියා වගේනෙ කියන්නෙ.

දැං කෙල්ලට ප්‍රොපෝසල් හෝ ගාලා එනවා.

හරි නෝනා හරි

නමුත් කෙල්ල කැමති නෑ.

ඒකත් හරි

ඒ ගෑනු ළමයා සාමාන්‍යයෙන්, බොරුනොකරන, බොරු නොකියන කෙනෙක්

ඔව් නෝනා නිවාඩු කාලවල්වලදි ආරක්ෂකය කට ගිහිල්ලා සිල් අරගෙන භාවනාත් කරලා තියෙනවා.

නමුත් දැං ගෙවල්වලින් බනිනවා යාලුවෙලා හිටිය කොල්ලා නැතුව වෙන අය කසාද බඳින්ඩ වෙනවට කරන බොරුවක් කියලා.

හරි

මාලනී හිතන්නෙ යාලුවා බොරුවක් කරනවා කියලද

කොහෙත්ම නෑ නෝනා

මාලනී මට තේරෙන හැටියට එයාට තියෙන්නෙ හිස්ටීරියාව (HYSTERIA) සිංහලෙන් කියනවනම් මායා රෝගය. ඔයාගෙ යාළුවා බොරු කරන්ඩ, බොරු කියන්ඩ කැමතිත් නෑ, නමුත් ගේන මංගල යෝජනා ප්‍රතික්ෂේප කරන්ඩත් ඕනෙ. ඉතින් ඒකට යටි හිත මගින් නිර්මාණය කරපු ලෙඩක් තමයි කොන්දෙ අමාරුව. ඒකනෙ කොන්දෙ අමාරුවට කායික හේතු අහුවෙන්නෙ නැත්තෙ. ඉතින් ඔය තත්වෙ අඩු කරන්ඩ ඕනෑනම් නියම යථා ස්වභාවය පැහැදිලි කරලා දීලා විරුද්ධ වෙන්ඩ සාධාරණ හේතු පෙන්නලා දීලා මනෝවිද්‍යා උපදෙස් ලබාදෙන්ඩ ඕනෙ.

එතකොට නෝනා බොරුකරන කෙනෙකුයි ඔයවගේ ලෙඩෙකුයි අදුරගන්නෙ කොහොමද?

වෙනදටත් බොරුකරන කෙනෙක් ද කියලා හොයලා බලන්ඩ පුළුවන්. තව එයාගෙ මානසික පරිසරය ගැන හොයලා බලන්ඩ පුළුවන්. කොහොමත් කරන්නෙ බොරුවක් නම් ඒක එකදිගට එක විදිහට කරන්ඩ අමාරුයි.

ඉතින් ඔයවගේ කාරණා හොයලා බලලා බොරුකරනවද නැද්ද කියලා දළ වශයෙන් අවබෝධයක් ලබාගන්න පුළුවන්.

තව මොනවගේ අවස්ථාවලදිද ඔයවගේ රෝගී තත්ව ඇතිවෙන්නෙ.

දරුවන්, තමන්ගෙ යේලි වගේ තමන්ගෙ ඥාතීන් තමන්ට නොසලකයි කියලා මේ වගේ රෝගී තත්ව ඇතිවෙන්න පුළුවන්. විභාග වගේ දේවල්වලට තියන භයනිසාත් මේ වගේ රෝගී තත්ව ඇතිවෙන්න පුළුවන්. ගොඩක් වෙලාවට මේ වගේ අය ශාන්තිකර්මවලදී ඒ මත විශ්වාසය තියලා ඒ රෝගයෙන් එකපාරටම මිදෙන අවස්ථා තියෙනවා. එතකොට කියනවා හාස්කමකින් ලෙඩා

සුව උනා කියලා. නමුත් කායික ආබාධ තියෙන රෝගියෙක් එහෙම එකපාරටම සුවකරන්න බෑ. ඒකට කායික ප්‍රතිකාර කරන්නම ඕනෙ. හාස්කම් තුළින් පෙනීම්, හාස්කම් තුළින් කතා කිරීම්, හාස්කම් තුළින් නැගිටින්න බැරි අය නැගිටීම් සිද්ද වෙන්නෙ ඔය විදිහට. හැමෝම සුවකරන්ඩ බෑ.

එතකොට නෝනා අමනුස්සයෝ වැහිලා ආවේශ වෙන ඒවත් මානසික රෝග කියලා හඳුන්වනවා නේද?

ඔව් මාලනී ඒවත් මේ හිස්ටීරියා රෝග පැත්තට තමයි වැටෙන්නෙ.

එතකොට නෝනා කියන්නෙ ඒ වගේ ආවේශ වීම් තියන කට්ටියට මොනවා හරි මානසික ගැටලු තියෙනවා කියලද?

ඔව් මාලනී.

එතකොට නෝනා අපි කලින් කථාකරපු රෝගවල සැබෑ රෝගත් තියනවා. සැබෑ රෝග විදිහට මායා රෝගත් තියෙනවා. එහෙම බලනකොට මායා රෝගයක් විදියට ආවේශවීම් තියෙනවානම්, සැබෑවටම ආවේශවීම් තියෙන්නත් පුළුවන් නේද?

ඔව් මාලනී මාලනීගේ තර්කෙ මම පිළිගන්නවා. නමුත් ඒ ගැන තවදුරටත් හොයලා බලන්න ඕනෙ. ආයුර්වේදයේ නම් භූත වෛද්‍ය විද්‍යාව කියලා වෙනමම ඔය සම්බන්ධ කොටසක් තියෙනවා. කොහොමඋනත් සැබෑම ආවේශවීම් තියෙනවානම්, සැබෑ ආවේශවීමයි. මායා ආවේශවීමයි වෙන වෙනම අදුරගෙන ප්‍රතිකාර කරන්න ඕනෙ. නැත්තං සුවයක් බලාපොරොත්තු වෙන්න බෑ.

13 වැනි පරිච්ඡේදය

මාලනී දොස්තර නෝනා හමුවෙනු පිණිස ඉස්කෝලෙ මහත්තයාලගෙ ගෙදර වාඩි වී සිටින විට මාලනී ඉදිරියෙන් මාලනී දෙස බලාගෙන දොස්තර

නෝනා ඇගේ කාමරය දෙසට යන්නට විය. එහෙත් මාලනී යෙදී සිටි කල්පනාවේමය. එවිට දොස්තර නෝනා

"මාලනී සිහි එලවාගන්ඩ" යනුවෙන් ප්‍රකාශ කරන්නට විය'

නෝනා ඔහොම කියනකොට මට බුදුහාමුදුරුවෝ මතක්ඵනා.

ඒ ඇයි මාලනී.

බුදුහාමුදුරුවෝ පටාචාරටත් ඔහොම කියලා තියනවා.

ඔව් මාලනී, ඒ කතාව මතක් වෙලා තමයි මම ඔයාට අර විදියට කථාකළේ. නැත්තං ඔයා මම ඉස්සරහෙන් ගියා කියලවත් දන්නෙ නෑනෙ.

අප්පේ නෝනා ඔය වගේ අකරතැබ්බ නම් මට ගොඩක් වෙලා තියනවා.

ආ... එහෙමද, එහෙමනම් අපි ඒ ගැන අහන්ඩ අපේ කථාමණ්ඩපේ පැත්තට යමු.

දෙදෙනාම දැන් කතා මණ්ඩපය තුළය.

එහෙනං මාලනී කියන්ඩකෝ.....

මම දවසක් පාරෙ යනකොට වෙන කල්පනාවක ගිහිල්ලා මම නොදැනුවත්වම පාර මැද්දට යැවුනා. මම ගිහිල්ලත් තිබුනෙ පාරෙ වැරදි පැත්තෙන්. ඊට පස්සෙ පිටිපස්සෙන් ආව වාහනයක් මගේ ළඟටම ඇවිල්ලා කොහෙද යන්නෙ කියලා සැරෙන් අහලා, පාරට බැස්සහම ඉන්නෙ අසිහියෙන් යන මිනිස්සු කියලා හිතාගන' තමන් සිහියෙන් පාරෙ යන්ඩ ඕනෙ කියලා කරුණාවන්ත විදිහට කියලා ගියා.

ආයෙ දවසක අපේ ගමේ ගියපු වෙලාවක කොස් කැඩුවා. සාමාන්‍යයෙන් කොස් කඩන කෙනා කොස් කඩලා ඉවර වෙනකල් කොස්ගහ යටට යන්නෙ නෑනෙ. ඒ උනාට කොස් කඩන වෙලාවෙ වැල ගෙඩියකුත් තිබිලා ඒක බිම වැටිලා මදුලු බේරිලා තිබුනෙ. වැලකන්ඩ තිබුනු ආසාව නිසා මම නිකම්ම එතෙන්ඩ යැවුනා. ඒත් එක්කම තව කොස් ගෙඩියක් වැටුනා. මම බේරුනේ අනූනමයෙන්. ඊට පස්සෙ මට ළඟ හිටපු කට්ටියගෙන් බැනුම් කෝටියයි.

මාලනී, සිහි එලවා ගන්නවා. එළඹ සිටි සිහියෙන් ඉන්නවා කියන වචනවල තේරුම මේ මොහොතේ කරන සහ සිදුවෙන වැඩවලට සිතයොමුකරගන ඉන්නවා කියන එක.

ඔය වගේ මාලනී අපි ගොඩක් දෙනෙක් එළඹ සිටි සිහියෙන් නෙවෙයි වැඩ කරන්නෙ. ඒක නිසා ගොඩක් අනතුරු සිද්ධ වෙනවා. අමතක වෙන්නත් බලපානවා. ගොඩක් අය එළඹසිටි සිහියෙන් නොසිටින නිසා මනෝ ලෝකවල තනි වෙලා දුක් විඳින අවස්ථා තියනවා.

එතකොට නෝනා කොහොමද අපි එළඹ සිටි සිහියෙන් කටයුතු කරන්නෙ.

මාලනී අපි පාරෙ යනවානම්, පාරෙ යන එක ගැන සිහිය පිහිටුවාගෙන කටයුතු කරන්න ඕනෙ. අපි පාඩම් කරනවා නම් පාඩම් කිරීම ගැන සිහිය පිහිටුවාගන කටයුතු කරන්න ඕනෙ. වෙනත් වැඩක් කරනවා නම් ඒ දේ ගැන සිහිය පිහිටුවාගන කටයුතු කරන්න ඕනෙ.

එතකොට නෝනා ඔය විදියට හිත තියාගන කටයුතු කරන්ඩ හැදුවට හිත අතීතයට, අනාගතයට දුවන ගතියක් තියෙනවනෙ.

ඒක මාලනී සාමාන්‍ය දෙයක්. ඒ බව අපි දැන ගත්ත ගමන් ආය අදාල දේට හිත යොදවන්න ඕනෙ. ඔය විදියට කාලයක් කරනකොට මතක ශක්තිය දියුණු වෙනවා. අතීතයේ දුක්බර තැන්වල මනසින් තනිවෙන්නෙ නැතුව සතුටින් ඉන්නත් පුළුවන්. ඒ වගේම තමන් කරන වැඩේ හරියට නිවැරදිව කරන්නත් පුළුවන්.

දැං තමා නෝනා මට හිතෙන්නෙ වැඩිදුර ඉගෙන ගන්න බැරි උනේ එළඹ සිටි සිහියෙන් කටයුතු නොකරපු නිසා කියලා.

14 වැනි පරිච්ඡේදය

බුරම්පි මාමාගේ පඩිදා ගමට ඉතා ප්‍රසිද්ධය. ඒ බුරම්පි මාමා මත්පැන් බී ගමටම ඇසීමට කෑ ගසන බැවිනි.

ඉස්කෝලෙ මහත්තයත්, ඉස්කෝලෙ හාමිනේත් ගේට්ටුව අසලය.

අර බුරම්පි නේද කෑගහගන එන්නෙ. එලෙස ඇසුවේ ලොකු ඉස්කෝලෙ මහතාය.

ඔව් ඔව්.

අද පඩි වෙන්ඩ ඇති මහත්තයා

මං දන්න විදිහට හාමිනේ අද පඩිනං නෑ

ටික වේලාවක් යන විට බුරම්පි මාමා ඉස්කෝලෙ මහත්තයා සිටින තැනට ආවේය.

බුරම්පි තමුන් බීලා නේද? එලෙස ඇසුවේ ලොකු ඉස්කෝලෙ මහතාය.

අනේ නෑ අපේ මහත්තයා මේක වෙන ප්‍රශ්නයක්. මම දවල් කෑමට ගෙදර එනකොට අපේ ගෑනි ගෙදර නෑ. දොරත් ලොක්කරලා ගිහිල්ලා වෙනදා යතුර හංගන තැන යතුරත් නෑ. ඒකයි මං කෑගැහුවෙ මහත්තයෝ.

මං හිතුවෙ තමුන් දෙකක් දාගෙනද කියලා.

නෑ නෑ මහත්තයා

එහෙමනම් ඔහොමම යන්ඩ අපේ කුස්සිය පැත්තට මං මැගිලින් ට කියන්නම් බුරම්පිට බත් ටිකක් බෙදන්ඩ කියලා.

බුරම්පි මාමා බත් කා ඉස්තෝප්පුව පැත්තට එන විට ලොකු ඉස්කෝලෙ මහත්තයා සුපුරුදු හාන්සි පුටුවේ හාන්සි වී සිටී. ඒ අතරතුර මාලනී ද පැමිණ දොස්තර නොනාගේ පැමිණීම අපේක්ෂාවෙන් ඒ අසල වාඩි වී සිටී.

බුරම්පි ඔහෙන් ඉඳගෙන මට කීවනං කෑගැහුවට පස්සෙ පුංචිනෝනා හම්බුනාද කියලා.

බුරම්පි මාමා නිරුත්තරය.

අපි හෙමිහිට හොයලා බලමුකෝ මොකද උනේ කියලා. අසනීපයක්වත් උනාද දන්නෙ නෑනෙ. තව ටිකකින් දොස්තර නෝනා එනවා. අපි විස්තර කියලා අහලා බලමුකො.

ටික වේලාවක් යන විට දොස්තර නෝනා පැමිණෙන්නට විය.

දුව අද ගෑණු වාට්ටුවට අලුතෙන් ලෙඩ්ඩු එහෙම ඇතුල් කරපුවා මතකද?

මතකයි ඉස්කෝලෙ මහත්තයා හැඩරුව කිව්වොත් තව හොඳට මතක් වෙයි.

නිකටෙ ලපයක් තියන වයස අවුරුදු හැටක විතර කෙනෙක්.

ඒ වගේ කෙනෙක් ඇතුල් කළා කලන්තයක් හැදිලා. නම නං මතකෙ හැටියට පුංචි නෝනා.

ඇහුනා නේද බුරම්පි.

එය ඇසු බුරම්පි මාමාගේ මූණ වැහිවලාවලින් මිඳුන පුන්සඳක් මෙන් බබලන්නට විය.

මාලනී, මම නාගෙන එන්නම් කියමින් දොස්තර නෝනා තමන් නැවතී සිටින කාමරයට යන්නට විය.

දොස්තර නෝනා නා ගැනීමෙන් පසු මාලනීට ද කෑමට ආරාධනා ලැබුණු අතර මාලනී ආහාර ගෙන සිටි බැවින් ලැබුණු ආරාධනාව ප්‍රතික්ෂේප කරන්නට විය.

මාලනීත් කාලා ඉන්න හින්දා මමත් පස්සෙ කන්නම්. අපි ටිකක් කථා කරමු.

දෙදෙනාම සුපුරුදු කථාමණ්ඩපයේ අසුන්ගන්නට විය.

මොකක්ද ඇවිල්ල හිටපු සීයගෙ ප්‍රශ්නෙ.

ඉස්කෝලෙ හාමිනේ කීව හැටියට බුරම්පි සීයා දවල්ට කෑමට ගෙදර එනකොට ගෙදර දොරවල් වහලා. කෑමත් නෑ කියලා තමයි පාරෙ කෑගහා ගිහිල්ලා තියෙන්නෙ.

දොස්තර නෝනා සුපුරුදු ලෙස පැහැදිලි කිරීම් ආරම්භ කරන්නට විය.

මාලනී බඩගින්න ගතට දැනෙන රිදිල්ලක්. ගතට දැනෙන රිදිල්ලට ආහාර ප්‍රමාදවීමේ හිතේ රිදිල්ලත්, ආහාර රස අඩුවීම වැනි හිතේ රිදිලිත් එකතු උනාම අපිට දැනෙන රිදිලි ප්‍රමාණය වැඩියි. නමුත් ආහාර ප්‍රමාදවීමෙන් හිතට දැනෙන වේදනාවක් ආකල්ප වෙනස් කරගැනීම තුලින් අඩුකරගන්න පුළුවන්. ආහාර ප්‍රමාද උනේ උයන අය අසනීප වීම තුළින් හෝ වෙනත් කරදරවලට මුහුණදීම තුළින් කියලා ආකල්ප වෙනස් කරගන්න පුළුවන්.

ආහාර රස අඩුවීම නිසා හිතට දැනෙන වේදනාව අඩුකර ගැනීමට මීට වඩා රස අඩු ආහාර තියනවා. ඒ අතින් බලනකොට මේවා හොඳයි නේද කියලා හිත හදාගන්න පුලුවන්. ආහාර ගන්නෙ රස බැලීමට වඩා අපේ එදිනෙදා කටයුතු කරගන යන්ඩ ශක්තිය ලබාගන්ඩ කියලා හිතලා ආහාර රස අඩුවීමේ වේදනාව අඩු කරගන්නත් පුළුවන්.

එතකොට ඉතිරි වෙන්නෙ බඩගින්න නිසා දැනෙන වේදනාව විතරයි. බඩගින්නත් අනිත්‍ය දෙයක්, බඩගින්න නැති වෙන්න ආහාර ලැබෙන්න පුලුවන් බව සිතීම තුළින් එයට ද යම්කිසි මානසික සහනයක් ලබාගන්න පුළුවන්.

එහෙමනං මාලනී දැං මට පැහැදිලි කරන්ඩ කෙනෙකුට ලෙඩක් හැදුනාම ඒ නිසා ඇතිවෙන හිතේ දුක අඩු කරගන්නෙ කොහොමද කියලා.

එය ඇසූ මාලනී දීර්ඝ හුස්මක් ගෙන පහත හෙළීමෙන් අනතුරුව දොස්තර නොනාගේ පැනයට පිළිතුරු සපයන්නට විය.

රෝගයක් ඇතිඋනාම ගතට දැනෙන වේදනාවයි හිතට දැනෙන වේදනාවයි කියලා අවස්ථා දෙකක් තියනවා. ඒ වගේ අවස්ථාවලදී හිතට දැනෙන වේදනාව ආකල්ප වෙනස් කර ගැනීම තුළින් අඩු කරගන්න පුළුවන්. ඊට පස්සේ ඉතිරි වෙන්නෙ ගතට දැනෙන වේදනාව.

රෝග කියන ඒවා හැමදාම එක විදියට පවතින දේවල් නෙවෙයි කියලා ආකල්පමය වෙනසක් ඇති කරගන්න පුළුවන්. රෝගය ගැනම හිත හිතා ඉන්න එක හිතට මහ බරක් ගෙන දෙන, දුකක් ගෙන දෙන දෙයක් බව හිතලා හිත සැහැල්ලු කරගන්න පුලුවන්. රෝග හැදිලා ඉන්නෙ මම විතරක් නෙවෙයි තව

කට්ටියත් ඉන්නවා කියලා හිත සැහැල්ලු කරගන්න පුලුවන්. ඒ වගේ ආකල්පමය වෙනස්කම් තුළින් හිතේ ඇතිවෙන වේදනාවල් අඩුකර ගන්න පුළුවන්.

මම තව එක කාරණාවක් ගැන මාලනීගෙන් අහන්නම්.

ඒ මොකක්ද නෝනා

"රස්සාවල් ගැන"

ඒ කෙදිත් නෝනා ශරීරයට දැනෙන වේදනාවයි, හිතට දැනෙන වේදනාවයි කියලා දෙකක් තියෙනවා. රැකියාවේදිත් හිතට දැනෙන වේදනාවල් ආකල්ප වෙනස්කර ගැනීම තුළින් අඩුකරගන්න පුළුවන්. මම මේ වැඩ කරන්නෙ මගේ රට වෙනුවෙන්, මම මේ වැඩ කරන්නෙ මගේ දරුවන් වෙනුවෙන්, මම මේ වැඩ කරන්නෙ ගෙයක් හදාගන්ඩ, මම මේ වැඩ කරන්නෙ ශරීරයට සහ මනසට දෙන හොඳ ව්‍යායාමයක් විදිහට කියලා හිතලා වැඩ කරන්න පුළුවන්.

රැකියාව නිසා ඇතිවෙන වේදනා තත්ව මට විතරක් නෙවෙයි රැකියා කරන අනික් අයටත් ඇතිවෙනවා කියලා හිතලා හිතේ පීඩන තත්ව අඩුකරගන්න පුළුවන්.

15 වැනි පරිච්ඡේදය

ගුරුගෙදර හාන්සිපුටු කිහිපයක් තිබුනත් ඉන් එක පුටුවක සාමාන්‍යයෙන් වාඩි වෙන්නෙ ලොකු ඉස්කෝලෙ මහතා පමණි. ඒ පුටු අතර තරමක් ඈතින් පිහිටි හාන්සි පුටුවක දොස්තර නෝනා බර කල්පනාවකය.

දුව බර කල්පනාවක වගේ. ඉස්කෝලෙ හාමිනේ ඒ ප්‍රශ්නය ඇසුවේ දොස්තර නොනාගේ කල්පනා දැහැන බිඳිමිනි.

මට මාරුවක් ඇවිල්ලා තියෙනවා. ඒක ගැන කල්පනා කර කර හිටියෙ.

ඒ මොකද මේ හදිස්සියේම.

නෑ මං දන් මෙහාට ඇවිල්ලත් සෑහෙන කාලයක් වෙනවනෙ.

කොහාටද දුව මාරුව.

ගාල්ලට තමයි මාරුව. ලබන සතියෙ යන්ඩ වෙනවා.

මාලනී මේ ආරංචිය දැනගත්තහමනං ගොඩක් දුක්වෙයි. මම මැගිලින් අතේ මාලනීට පණිවිඩයක් අරින්නම්කො දුව ඇවිල්ලා හම්බවෙන්න කියලා.

ටික වේලාවක් යනවිට ලොකු ඉස්කෝලෙ මහතාද ඒ අසලට පැමිණෙන්නට විය.

මේ දුවට මාරුවක් ඇවිල්ලා ගාල්ලට ලබන සතියෙ යන්ඩ වෙනවලු.

ඔහොම තමා දුව රාජ්‍ය සේවයේ හැටි. ඒත් දුව මෙහෙන් යනඑකටනං අපිට ගොඩක් දුකයි. එලෙස කීවේ ලොකු ඉස්කෝලෙ මහතායි.

මාලනීද මැගිලින්ගේ පණිවිඩය ලැබීමෙන් පසුව දොස්තර නෝනා හමුවෙනු පිණිස ගුරු ගෙදරට පැමිනෙන්නට විය.

මට එන්ඩ කියලා පණිවිඩයක් ඇරලා තිබුණා.

ඔව් මාලනී, මට මාරුවක් ඇවිල්ලා තියෙනවා ගාල්ලට. ලබන සතියෙ මෙහෙන් යන්ඩ වෙනවා. ඒක කියන්ඩයි එන්ඩ කීවෙ.

මේ පණිවිඩය ලැබෙනවිට මාලනී සිටියේ දොස්තර නොනාගේ කාමරය තුළය. පණිවිඩය ලැබීමෙන් පසු දොස්තර නෝනාගේ ඇඳමත මාලනීට ඉබේටම ඉන්දවිනි.

නෝනා යන එක ගැන නම් මට ගොඩක් දුකයි.

මටත් එහෙමයි මාලනී. ඔයාලා දාලා යන්ඩ වෙන එක ගැන හිතට ගොඩක් දුකයි. ඒත් මොනවා කරන්නද මාලනී හැම හමුවීමක් තුළම වෙන්වීමක් ගැබ්වෙලා තියෙනවනෙ. අනිත් එක මාලනී හැමදෙයක්ම අපට අවශ්‍ය විදිහටම තීරණය කරන්ඩ බෑනෙ. එහෙම හිතලා අපි හිත හදාගම්මු.

නෝනා එක්කරගෙන යන්ඩ අප්පච්චි එනවද?

ඔව්, අම්මයි අප්පච්චියි දෙන්නම එනවා කියලා තියෙනවා.

නෝනට යන දවසට අරගන යන්ඩ මම කිරිටොපි ටිකක් හදාගෙන එන්නම්.

හා හොඳයි මාලනී.

එහෙනං නෝනා මං ගිහිල්ලා එන්නම්, මාලනී එලෙස කියන විට දොස්තර නෝනා මාලනීගේ එක අතක ඇඟිලිවලින් අල්ලා යන්තමින් මිරිකා බුරුල් කරමින් හා හොඳයි මාලනී යනුවෙන් ප්‍රකාශ කරන්නට විය.

ඉන්පසු නියමිත දිනය උදා වූ අතර එදින දොස්තර නෝනා සියල්ලන්ටම සුහදව සමුදී තම මවුපියන් සමඟ හොරණ බලා පිටත්වන්නට විය.

16 වැනි පරිච්ඡේදය

දොස්තර නෝනා කුඹුක්ගම රෝහලෙන් මාරු වී වසරකට පමණ පසු.

ටීන්... ටීන්... ටීන්... ටීන් ඒ ලොකු ඉස්කෝලෙ මහතාගේ නිවසේ දුරකථනය නාද වෙන හඬයි.

රිසීවරය ඉස්සුවේ ලොකු ඉස්කෝලෙ මහතායි.

හලෝ.....

මම හොරණින් කතා කරන්නෙ. මහත්තයාලගෙ ගෙදර නතර වෙලා හිටිය දොස්තර නෝනගෙ අප්පච්චි.

කියන්ඩ, කියන්ඩ මහත්තයා හුඟකාලෙකින්නෙ කථාකළේ.

මහත්තයා මම කථාකළේ උදව්වක් ඉල්ලගන්ඩ. මගේ යාලුවෙක් ඉන්නවා අනුරාධපුරේ. එයත් හම්බවෙලා ඔය පැත්තෙ ඇවිල්ලා මහත්තෙලාගෙ ගෙදර නතරවෙලා පහුවදාට යන්ඩ පුලුවන්ද බලන්න කථාකළේ.

එන්ඩ එන්ඩ මහත්තයා, මහත්තෙලා කවදද එන්නෙ.

අපි අනිද්දට එන්ඩ බලාපොරොත්තු වෙනවා. මහත්තෙලා එදාට ගෙදර ඉන්නවද?

ඔව් මහත්තයා මහත්තයලා එන්ඩ අපි බලාපොරොත්තුවෙන් ඉන්නෙ.

ලොකු ඉස්කෝලෙ මහතා බලාපොරොත්තු වූ පරිදි අදාළ දිනයේ සවස දොස්තර නෝනාගේ පියත් මවත් තෑගිබෝගද රැගෙන ලොකු ඉස්කෝලෙ මහතාගේ නිවසට පැමිණෙන්නට විය.

අමුත්තන් දෙදෙනාටම නා පිරිසිදු වීමට ගුරු ගෙදරින් සහය ලැබුණු අතර ඉන්පසුව ඉස්කෝලෙ මහතා ගජධීර මහතා සමගත් ඉස්කෝලෙ හාමිනේ ගජධීර මහතාගේ බිරිඳ සමගත් කෝපි බොමින් දොඩමලු වන්නට විය.

මහත්තයා කැමතිනම් ගෙදර ගිහිල්ලා හදාගන බොන්ඩ පුළුවන් හොඳ ඖෂධයක් දෙන්ඩ පුළුවන්.

ඒ මොනවද ඉස්කෝලෙ මහත්තයා.

වේලපු රණවරා ටිකක්.

බොහොම අගෙයි. මමත් කැමති ඒ වගේ දේවල්වලට තමයි. තේ බොනවට වැඩිය ඒ වගේ දේවල් ගොඩක් වටිනවා. අපේ රටේ ගහකොළ රැකගත්තොත් ඒවගෙන් අපිට බොහෝම ප්‍රයෝජන ගන්න පුළුවන්. මම නං දකින විදියට ඖෂධ නිපදවලා පිටරටට උනත් යවන්න පුළුවන්. මහා රාවණා රජ්ජුරුවන්ගෙ කාලෙ බේත් හදලා පිටරටටත් යවලා තියෙනවා කියලා මම අහලා තියෙනවා. එදා පුළුවන් උනානම් අද බැරිවෙන්ඩ බෑනෙ ඉස්කෝලෙ මහත්තයා. අපට අවශ්‍ය දේවල් මෙහෙ තියෙද්දි ඒවගෙන් ප්‍රයෝජන නොගෙන පිටරට දිහාම බලාගෙන ඉන්නවා.

සහතික ඇත්ත, සහතික ඇත්ත.

බලාගෙන යනකොට ගජධීර මහත්තයා අපි දෙන්නගෙම අදහස් ගොඩක් එකවාගෙනෙ.

ඒකනෙ ඉස්කෝලෙ මහත්තයා එක ජාතියේ කුරුල්ලො එක අත්තෙ වහනවා කියන්නෙ.

ගජධීර මහතා එය ප්‍රකාශ කළේ මද සිනාවක් මුවගට නංවමිනි.

මහත්තයා ඔහොම කියනකොට මට සංයුක්ත නිකායේ ධාතුසංයුත්තෙ කතාවක් මතක් උනා.

ඒ මොකද මහත්තයා.

ධාතුසංයුත්තෙත් ඔයවගේ කාරනාවල් තියනවා. මහත්තයා කැමතිනම් මම කියන්නම්.

මම ධර්ම කරණු අහන්ඩ බොහෝම කැමැතියි මහත්තයා, මහත්තයා කියන්ඩ.

බුදුහාමුදුරුවෝ රජගහනුවර ගිජුකුළු පව්වෙ වැඩ හිටපු කාලෙක සැරියුත් හාමුදුරුවෝ බොහෝ හාමුදුරුවරුන් සමඟ බුදුහාමුදුරුවෝ සමීපයේ සක්මනේ යෙදෙනවා.

මුගලන් හාමුදුරුවොත් බොහෝ හාමුදුරුවරුන් සමඟ බුදුහාමුදුරුවෝ සමීපයේ සක්මනේ යෙදෙනවා.

මහා කාශ්‍යප හාමුදුරුවොත් බොහෝ හාමුදුරුවරුන් සමඟ බුදුහාමුදුරුවෝ සමීපයේ සක්මනේ යෙදෙනවා.

අනුරුද්ධ හාමුදුරුවොත් බොහෝ හාමුදුරුවරුන් සමඟ බුදුහාමුදුරුවෝ සමීපයේ සක්මනේ යෙදෙනවා.

මන්තානි පුත්ත පුණ්ණ හාමුදුරුවොත් බොහෝ හාමුදුරුවරුන් සමඟ බුදුහාමුදුරුවෝ සමීපයේ සක්මනේ යෙදෙනවා.

උපාලි හාමුදුරුවොත් බොහෝ හාමුදුරුවරුන් සමඟ බුදුහාමුදුරුවෝ සමීපයේ සක්මනේ යෙදෙනවා.

ආනන්ද හාමුදුරුවොත් බොහෝ හාමුදුරුවරුන් සමඟ බුදුහාමුදුරුවෝ සමීපයේ සක්මනේ යෙදෙනවා.

දෙව්දත් හාමුදුරුවොත් බොහෝ හාමුදුරුවරුන් සමඟ බුදුහාමුදුරුවෝ සමීපයේ සක්මනේ යෙදෙනවා.

ඒ මොහොතෙ බුදුහාමුදුරුවෝ අනෙක් හාමුදුරුවරුන්ගෙන් විමසා සිටිනවා අර බොහෝ හාමුදුරුවරුන් සමඟ සක්මනේ යෙදෙන සැරියුත් හාමුදුරුවෝ දුටුවද කියලා. ඒ හාමුදුරුවරු එසේයැයි පිළිතුරු ලබාදෙනවා. ඉන්පසුව බුදුහාමුදුරුවෝ දේශනා කරනවා උන්වහන්සේලා සියලු දෙනාම ප්‍රඥාවන්ත බව.

ඉන්පසු බුදුහාමුදුරුවෝ අර හාමුදුරුවරුන්ගෙන් විමසා සිටිනවා අර බොහෝ හාමුදුරුවරුන් සමඟ සක්මනේ යෙදෙන මුගලන් හාමුදුරුවෝ දුටුවද කියලා. ඒ හාමුදුරුවරු එසේයැයි පිළිතුරු ලබාදෙනවා. ඉන්පසුව බුදුහාමුදුරුවෝ දේශනා කරනවා උන්වහන්සේලා සියලු දෙනාම ඍද්ධිබල සම්පන්න බව.

ඉන්පසු බුදුහාමුදුරුවෝ විමසා සිටිනවා බොහෝ හාමුදුරුවරුන් සමඟ සක්මනේ යෙදෙන කාශ්‍යප හාමුදුරුවෝ දුටුවද කියලා. ඒ හාමුදුරුවරු එසේයැයි පිළිතුරු ලබාදෙනවා. ඉන්පසුව බුදුහාමුදුරුවෝ දේශනා කරනවා උන්වහන්සේලා සියලු දෙනාම දෘතාන්ගධාරී බව.

ඉන්පසු බුදුහාමුදුරුවෝ විමසා සිටිනවා බොහෝ හාමුදුරුවරුන් සමඟ සක්මනේ යෙදෙන අනුරුද්ධ හාමුදුරුවෝ දුටුවද කියලා. ඒ හාමුදුරුවරු එසේයැයි පිළිතුරු ලබාදෙනවා. ඉන්පසුව බුදුහාමුදුරුවෝ දේශනා කරනවා උන්වහන්සේලා සියලු දෙනාම දිවැස්ලාභීන් බව.

ඉන්පසු බුදුහාමුදුරුවෝ විමසා සිටිනවා බොහෝ හාමුදුරුවරුන් සමඟ සක්මනේ යෙදෙන මන්තානි පුත්ත පුණ්ණ හාමුදුරුවෝ දුටුවද කියලා. ඒ හාමුදුරුවරු එසේයැයි පිළිතුරු ලබාදෙනවා. ඉන්පසුව බුදුහාමුදුරුවෝ දේශනා කරනවා උන්වහන්සේලා සියලු දෙනාම ධර්ම කථිකයන් බව.

ඉන්පසු බුදුහාමුදුරුවෝ විමසා සිටිනවා බොහෝ හාමුදුරුවරුන් සමඟ සක්මනේ යෙදෙන උපාලි හාමුදුරුවෝ දුටුවද කියලා. ඒ හාමුදුරුවරු එසේයැයි පිළිතුරු ලබාදෙනවා. ඉන්පසුව බුදුහාමුදුරුවෝ දේශනා කරනවා උන්වහන්සේලා සියලු දෙනාම විනයධර බව.

ඉන්පසු බුදුහාමුදුරුවෝ විමසා සිටිනවා බොහෝ හාමුදුරුවරුන් සමඟ සක්මනේ යෙදෙන ආනන්ද හාමුදුරුවෝ දුටුවද කියලා. ඒ හාමුදුරුවරු එසේයැයි පිළිතුරු ලබාදෙනවා. ඉන්පසුව බුදුහාමුදුරුවෝ දේශනා කරනවා උන්වහන්සේලා සියලු දෙනාම බහුශ්‍රැත බව.

ඉන්පසු බුදුහාමුදුරුවෝ විමසා සිටිනවා බොහෝ හාමුදුරුවරුන් සමඟ සක්මනේ යෙදෙන දෙව්දත් හාමුදුරුවෝ දුටුවද කියලා. ඒ හාමුදුරුවරු එසේයැයි පිළිතුරු ලබාදෙනවා. ඉන්පසුව බුදුහාමුදුරුවෝ දේශනා කරනවා උන්වහන්සේලා සියලු දෙනාම පාපිෂ්ට බව.

ඉන්පසුව බුදුහාමුදුරුවෝ අර හාමුදුරුවරුන්ට දේශනා කරනවා සත්වයෝ අදහස් වශයෙන්ම සැසඳෙන එකතුවෙන බව. එසේ සඳහන් කරලා ඒ ගැන තව උදාහරණත් දේශනා කරනවා.

මේකෙන් ඉස්කෝලෙ මහත්තයා අපිට හිතාගන්ඩ තියෙන්නෙ එක ජාතියේ දේවල් ඒ ඒ සමාන දේවල්වලට කිට්ටුවෙනවා එකතුවෙනවා කියන එක ස්භාව ධර්මයේ තියෙන න්‍යායක් කියලා නේද?

මහත්තයා අපේ හිත තුළ යහපත් සිතිවිලි ඇතිකර ගත්තොත්, යහපත් ක්‍රියාවල යෙදුනොත්, යහපත් පුද්ගලයොත්, යහපත් දේවලුත් ළංවෙයි කියලා තමයි මම විශ්වාස කරන්නෙ.

මදසිනා පාමින් හිසඋස්පාත් කරමින් ගජධීර මහතාද එය අනුමත කරන්නට විය.

ඔය විදිහට බලනකොට ඉස්කෝලෙ මහත්තයා හිතේ කලබලගති, නොසන්සුන්ගති වැඩි අය ළඟට ඒ වගේ අයයි අයහපත් අසාර්ථක සිදුවීනුයි ළංවෙනවා ඇති. ඒ වගේම හිත සංසුන් කලබල නැති යහපත් ක්‍රියා තියෙන අය ළඟට ඒ වගේ අයයි යහපත් සාර්ථක දේවලුයි ළංවෙනවා ඇති.

නමුත් ගජධීර මහත්තයා ලෝකෙ සමහර දේවල් දිහා බලනකොට එහෙම නෙමෙයි වගේ පේන්නෙ. නමුත් ප්‍රමාද වෙලා හරි එහෙම තමයි වෙන්නෙ. ඒකනෙ සමහරු අපි කොච්චර හොඳ කරත් නරකමයි එන්නෙ කියලා කරන හොඳත් නතර කරන්නෙ. ඒ වගේම සමහර නරක වැඩ කරන මිනිස්සු ඒවගෙ

ප්‍රතිඵල එන්ඩ ප්‍රමාද නිසා අපි මොන වැඩේ කරත් අපිට නරකක් වෙන්නෙ නෑ කියලා හිතාගන නරක වැඩම කරන්නෙ.

ඉස්කෝලෙ මහතා එසේ කියන විට ගජධීර මහතා එය අනුමත කරමින් හිස වනන්නට විය.

හාමිනේ හාමිනේ

ඇයි අපේ මහත්තයා

මැගිලින්ට කියන්ඩ හෙට උදේට මේ මහත්තයාලටත් එක්ක කැඳ හදන්න කියලා.

එතකොට ඉස්කෝලෙ මහත්තයා අපේ ජනවහරේ තියෙනවා නේද දුර්වල පුද්ගලයෙක් දැක්කහම කැඳ බීලා වගේ කථාවක්. ඒ ගැන ඔබතුමා මොකද හිතන්නෙ.

කැඳ බීවම ඇඟට පණ මදි ගතිනම් මට මේ වෙනකල් ඇවිත් නෑ. වැඩිපුර බීවම එහෙම වෙන කැඳ වර්ග තියනවද කියන්න මම දන්නෙ නෑ. සමහරවිට කැඳ බීවා වගේ කියන කතාව මිථ්‍යා කථාවක් වෙන්නත් පුළුවන්. නැත්නම් අර වෙන තෙල්ජාති විකුණාගන්න පොල්තෙල් හොඳ නෑ කීවාවගේ වෙන්නත් පුළුවන්.

එතකොට ඉස්කෝලෙ මහත්තයා හඳහන් සාස්තරේ ගැන මොකද හිතන්නෙ.

හඳහන කියන්නෙ උත්පත්තියත් එක්ක බැඳුන වාර්තාවක්. හරියට වෛද්‍ය වාර්තාවක් වගේ. වෛද්‍ය වාර්තාවෙ තියෙන සමහර දේවල් අපේ ක්‍රියාමාර්ග අනුව වෙනස් කරගන්න පුළුවන්. හඳහනේ තියෙන සමහර දේවලුත් අපේ ක්‍රියාමාර්ග අනුව වෙනස් කරගන්න පුළුවන් කියලා තමයි මම හිතන්නෙ.

උදාහරණයක් විදිහට තුනේ පංතියේ ඉන්න දුර්වල ළමයෙක් දැකලා අපි හිතින් වාර්තාවක් හදනවා එයාට විශ්ව විද්‍යාලයට යන්න බැරිවෙයි කියලා. නමුත් පසුකාලීනව වෙනස් කරගන හෝ වෙනස්වෙලා එයා විශ්ව විද්‍යාලයට තේරෙන්න පුළුවන්. ඒකේ අනිත් පැත්තත් එහෙමයි. සමහරවිට අපි හිතපු දේ හරි යන්නත් පුළුවන්.

හාමිනේ... හාමිනේ...

ඒ ඉස්කෝලෙ මහත්තෙලාගේ ගෙදර වැඩට ඉන්න මැගිලින්ගේ හඬය. ඒ හඬ ඇසී සුළු මොහොතකින් ඉස්කෝලෙ හාමිනේ රාත්‍රී ආහාරය සඳහා අමුත්තන්ට වතුර පිළිගන්වන්නට විය.

රාත්‍රී ආහාරය ගන්නා විට තරමක් ප්‍රමාද වූ බැවින් ආහාර ගැනීමෙන් අනතුරුව සියළු දෙනාම නින්දට යන්නට විය.

පසුදින උදෑසන ආහාර ගැනීමෙන් පසු ගජධීර මහතාත් බිරිඳත් ආපසු පිටත් වීමට ආසන්න මොහොතේ ගජධීර මහතාගේ බිරිඳ ගජධීර මහතා අතට බුලත් සමග ආරාධනා පත්‍රයක් භාරදෙන්නට විය. එය අතට ගෙන ගජධීර මහතා ඉස්කෝලෙ මහතාටත්, ඉස්කෝලෙ හාමිනේටත් දැක්වූ ආගන්තුක සත්කාරවලට තුති පුදන්නට විය. ඒ අවස්ථාවේදී බුලත් අත සමඟ ආරාධනා පත්‍රය ඉස්කෝලෙ මහතාගේ අතට දුන් ගජධීර මහතා මෙලෙස ප්‍රකාශ කරන්නට විය.

මහත්තයා අපි ආවෙ ලොකු දුවගෙ මඟුල්ගෙදර මතක්කරලා යන්න. මහත්තයලා එන්ඩම ඕනෙ.

මමයි හාමිනෙයි අනිවාර්යෙන්ම එනවා මහත්තයා.

එතකොට මහත්තයා මාලනීටත් ආරාධනා පත්‍රයක් දෙන්න කියලා දුව එකක් ලියලා දුන්නා.

එහෙමනම් මහත්තයා මම මාලනීලගෙ ගෙදර යන්ඩ අපේ හාමිනෙයි මැගිලිනුයි එවන්නම්.

එලෙස මාලනීගේ නිවසට යෑමට තීරණය වූ අතර ගජධීර මහතාත් බිරිඳත් දෑත් එක්කොට ඉස්කෝලෙ මහතාටත්, බිරිඳටත් ආචාර සමාචාර කරන්නට විය.

නිමි.



ISBN - 978-955-38808-1-9

9 789553 880819

මිල : රු 400.00